VERITÉ RESEARCH
Strategic Analysis for Asia

VERITÉ MEDIA
Better Media Culture

Supported by Kingdom of the Netherlands

# ශ්‍රී ලංකාවේ කාන්තාවන්, ගැහැණු දරුවන් සහ LGBTQIA+ පුද්ගලයින් පිළිබඳ වාර්තාකරණය: වෘත්තීමය මාධ්‍යකරණය සඳහා අත්පොතක්



Image credit: AI-generated illustration

# ස්තුතිය

මෙම අත්පොත ශ්‍රී ලංකාවේ නෙදර්ලන්ත රාජධානියේ තානාපති කාර්යාලයේ සහයෝගය ඇතිව වෙරිටේ මාධ්‍ය සහ දේශපාලන අංශය (Verité Media and Politics) විසින් සම්පාදනය කරන ලද්දකි.

මාධ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීය මට්ටම නැංවීමටත්, විශ්වාසදායක තොරතුරු සඳහා මහජන අවබෝධය සහ ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ දැක්ම ඇතිවත්, 2016 වසරේදී මෙම අංශය ස්ථාපිත කරන ලදි. මාධ්‍ය වගවීම, ආචාරධාර්මික ජනමාධ්‍යකරණය සහ තොරතුරුවල නිරවද්‍යතාව පිළිබඳව තිරසාර අවධානයක් යොමු කිරීම තුළින් මෙම කණ්ඩායම යටකී මෙහෙවර ඉදිරියට ගෙන යයි. වෙරිටේ මාධ්‍ය සහ දේශපාලන අංශය විසින් Ethics Eye (එතික්ස් අයි), FactCheck.lk, The Divide (ද ඩිවයිඩ්) සහ Media Ownership Monitor-Sri Lanka (මාධ්‍ය හිමිකාරිත්වය අධීක්ෂණය කිරීමේ පර්යන්තය) යන සුවිශේෂී මහජන සේවා සහ අධ්‍යාපනික පර්යන්තයන් පවත්වා ගෙන යනු ලබයි. ඒ හරහා මාධ්‍ය වාර්තාකරණයේ ප්‍රමිතීන් ඉහළ නැංවීමටත්, තොරතුරු මුලාව සහ දුස්තොරතුරුවලට එරෙහිව ක්‍රියා කිරීමටත්, ධ්‍රැවීකරණයට විසඳුම් සෙවීමටත්, මාධ්‍ය පාලනයේ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීමටත් එම අංශය කටයුතු කරයි.

පර්යේෂණ කණ්ඩායම දේශිත කදිරගොන්න, ක්‍රිෂාරි ද අල්විස්, සජිනි වික්‍රමසිංහ සහ තෙරුණි රණතුංග යන අයගෙන් සමන්විත විය. මෙම අත්පොත මහෝෂධී පීරිස් විසින් සම්පාදනය කරන ලද අතර එය මුලින්ම ඉංග්‍රීසි භාෂාවෙන් ලියන ලද්දකි.  මෙයට අවශ්‍ය උපදේශාත්මක මගපෙන්වීම දීපාංජලී අබේවර්දන සහ ආචාර්ය නිශාන් ද මෙල් විසින් ලබා දෙන ලදි. මෙහි සිංහල පරිවර්තනය රවීකා ප්‍රනාන්දු සහ දීපාංජලී අබේවර්දන විසින් සිදු කරන ලද අතර, දමිළ පරිවර්තනය එඩ්වඩ් උදයදාස් සහ රොෂෙල් කනගසබේ විසින් සිදු කරන ලදි. මෙහි ආකෘතිකරණය (Formatting) මුආද් හිමාස් විසින් සිදු කරන ලදි.

කෙටුම්පත් සමාලෝචනය කිරීමටත්, අදහස් හුවමාරු කර ගැනීමටත්, මෙම අත්පොත වැඩිදියුණු කිරීමට ඒ පිළිබඳ තම ප්‍රතිචාර ලබාදීමටත් නොමසුරුව සිය කාලය කැප කළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් සහ සියලුම පාර්ශ්වකරුවන් වෙත පර්යේෂණ කණ්ඩායම සිය හෘදයංගම කෘතඥතාව පළ කර සිටී.

**නිර්දේශිත උපුටා දැක්වීම:** වෙරිටේ මාධ්‍ය සහ දේශපාලන අංශය. (2026). *A Handbook for Professional Journalism: Reporting on Women, Girl-children, and LGBTQIA+ Individuals in Sri Lanka (වෘත්තීය ජනමාධ්‍යකරණය සඳහා වන අත්පොතක්: ශ්‍රී ලංකාවේ කාන්තාවන්, ගැහැණු දරුවන් සහ LGBTQIA+ පුද්ගලයින් පිළිබඳ වාර්තාකරණය).* වෙරිටේ රිසර්ච්.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

# පටුන


**හැඳින්වීම ....................................................................................................................5**

මාධ්‍යයේ අරමුණ සහ භූමිකාව ....................................................................................................5

මාධ්‍යයේ බලපෑම ....................................................................................................5

මෙම අත්පොතේ අරමුණ ....................................................................................................6

මාධ්‍ය තුළ නිරතුරුව දක්නට ලැබෙන ගැටලුකාරී වාර්තාකරණ රටා ....................................................................................................6

මෙම අත්පොත මගින් ආවරණය කෙරෙන කරුණු....................................................................................................8

මෙම අත්පොත සම්පාදනය කිරීමේදී අනුගමනය කළ ක්‍රමවේදය ....................................................................................................8

හානිය අවම කිරීම: මෙම මාර්ගෝපදේශවලට පාදක වී ඇති මූලික ප්‍රතිපත්තිය ....................................................................................................9

**1 පරිච්ඡේදය: ස්ත්‍රී පුරුෂ සමාජභාවීය නියෝජනය හා සම්බන්ධ වාර්තාකරණය................................11**

1.1කාන්තාවන්ගේ වෘත්තීය සුදුසුකම් හෝ තාක්ෂණික නිපුණතාව හෑල්ලුවට ලක් කරන අපහාසාත්මක භාෂා භාවිතයෙන් වැළකී සිටිමු ....................................................................................................12

1.2සමාන අවස්ථාවලදී පිරිමින්ගෙන් සහ කාන්තාවන්ගෙන් වෙනස් ප්‍රශ්න ඇසීමෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘති (Gender stereotypes) තහවුරු කිරීමෙන් වැළකෙමු ....................................................................................................14

1.3 කාන්තාවන් අතාර්කික, පහත් හෝ අදක්ෂ පුද්ගලයින් වශයෙන් පිළිබිඹු කරන නිෂේධනාත්මක යෙදුම් භාවිතා කිරීමෙන් වැළකෙමු ....................................................................................................15

1.4 කාන්තාවන් ලිංගිකකරණයට ලක් කිරීමෙන් හෝ ඔවුන්ගේ බාහිර පෙනුම අනවශ්‍ය ලෙස ඉස්මතු කිරීමෙන් හෝ වැළකෙමු ....................................................................................................16

1.5 කාන්තාවන් හෝ කාන්තාවන් බහුලව නියැලෙන වෘත්තීන් හැඳින්වීමට යල් පැන ගිය හෝ අවමන්සහගත වෘත්තීමය යෙදුම් භාවිතා කිරීමෙන් වැළකෙමු ....................................................................................................17

සාරාංශය - ස්ත්‍රී පුරුෂ නියෝජනය පිළිබඳ වාර්තා කිරීමේ පිරික්සුම් ලැයිස්තුව ....................................................................................................19

**2 පරිච්ඡේදය: ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවට අදාළ වාර්තාකරණය ....20**

2.1 විශේෂයෙන්ම සෘණාත්මක සන්දර්භයන්හිදී LGBTQIA+ අනන්‍යතාව ඉස්මතු කිරීම මගින් සිදු කෙරෙන සෘණාත්මක අනන්‍යතා නිරූපණයෙන් (Negative identity profiling) වැළකී සිටිමු ....................................................................................................20

2.2 අපහාසාත්මක යෙදුම්, උපහාසය උපදවන සහ “අසාමාන්‍යතාව” හුවා දක්වන භාෂා භාවිතයෙන් වැළකී සිටිමු ....................................................................................................22

2.3 LGBTQIA+ පුද්ගලයින් නිරූපණය කිරීමේදී ගෞරවය හඟවන දෘශ්‍ය රූප තෝරා ගනිමු ....................................................................................................24

සාරාංශය - ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවට අදාළ වාර්තාකරණය සඳහා පිරික්සුම් ලැයිස්තුව ....................................................................................................25

**3 පරිච්ඡේදය: ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තාකරණය ....................................................................................................26**

3.1 සංස්කෘතික වශයෙන් සාමාන්‍යකරණය වී තිබුණ ද, අපහාසාත්මක හෝ නින්දාසහගත වචන භාවිතයෙන් වැළකෙමු ....................................................................................................26

3.2 ප්‍රචණ්ඩත්වය සුළු කොට තැකීමෙන් හෝ භාවාතිශය ලෙස වාර්තා කිරීමෙන් වැළකෙමු ....................................................................................................28

3.3 අපරාධයට ගොදුරු වූ තැනැත්තාගේ අනන්‍යතාව සුරකිමු ....................................................................................................28

3.4 විස්තරාත්මකව අපරාධය වාර්තා කිරීමෙන් වැළකෙමු; උචිත අවස්ථාවලදී පූර්ව අනතුරු ඇඟවීම් (Trigger warnings) භාවිතා කරමු ....................................................................................................30

3.5 වින්දිතයාට/වරදට මුහුණ දුන් කෙනාට වරද නොපටවා (Blame-shifting), අපරාධකරු පමණක් වගවීමට ලක් කරමු ....................................................................................................31


සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

3.6 අපරාධයට ගොදුරු වූ පුද්ගලයින් අසරණ පිරිසක් වශයෙන් නිරූපණය කිරීමෙන් වැළකෙමු ..........................32

3.7 අපරාධයට අදාළ සන්දර්භය විස්තර කර, සහය ලබා ගැනීමේ මාර්ග වෙත ඒට මුහුණ දුන් පුද්ගලයින් යොමු කරමු ........................................................................................................................................33

සාරාංශය - ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තාකරණයට අදාළ පිරික්සුම් ලැයිස්තුව ...........................................34

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

# හැඳින්වීම

## මාධ්‍යයේ අරමුණ සහ භූමිකාව

යහපත් ජනමාධ්‍යකරණය පොදු ජනතාවගේ යහපත පිණිස පවතී: එනම්, ජන ජීවිතයට සහභාගි වීමටත්, විවිධ ප්‍රකාශයන් ඇගයීමට ලක් කිරීමටත්, බලතල දරන්නන් වගවීමට ලක් කිරීමටත් අවශ්‍ය නිවැරදි තොරතුරු ජනතාව වෙත ලබා දීම මාධ්‍ය මගින් සිදු කෙරේ. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ/UNESCO) මෙම ප්‍රජාතන්ත්‍රවාදී කාර්යභාරය පැහැදිලිව සාරාංශගත කරයි - එනම්, ගුණාත්මක ජනමාධ්‍යකරණය, රජයේ වගවීම සහ ප්‍රජා සහභාගිත්වය ශක්තිමත් කිරීමට හේතු වේ.[1] වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ (Society of Professional Journalists) ආචාරධර්ම පද්ධතිය  සහ ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ (International Federation of Journalists) ගෝලීය ආචාරධර්ම ප්‍රඥප්තිය (Global Charter of Ethics) වැනි මූලික වෘත්තීය ප්‍රමිතීන් තුළින් ද මෙම මහජන සේවා අරමුණ පිළිබිඹු වේ. කිසියම් දෙයක් පිළිබඳව මහජනතාවට දැනගැනීමට ඇති අයිතිය මත ජනමාධ්‍යකරණය පදනම් විය යුතු බව අවධාරණය කරන අතරම, තොරතුරු රැස් කිරීමේදී සහ ප්‍රකාශයට පත් කිරීමේදී වගකීම, ස්වාධීනත්වය සහ වගවීම පවත්වා ගැනීමේ ඇති අවශ්‍යතාව ද මෙම වෘත්තීය ප්‍රමිතීන් මගින් ඉස්මතු කෙරේ.[2]

ඇතැම් පුද්ගලයින් මාධ්‍ය වාර්තාකරණයන් තුළ නිරූපණය කෙරෙන ආකාරය නිසා ඔවුන් ප්‍රසිද්ධියේ නින්දාවට ලක් විය හැකි අතර, එවැනි පුවත් හේතුවෙන් ඔවුනට පෞද්ගලික ජීවිතය තුළ ගැටලුවලට මුහුණ දීමට ද වැඩි ඉඩක් තිබේ. එවැනි පුද්ගලයින් පිළිබඳව වාර්තා කිරීමේදී මාධ්‍යයේ යටකී භූමිකාව වඩා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ කාන්තාවන්, ගැහැණු දරුවන් සහ LGBTQIA+ පුද්ගලයින් පිළිබඳව නිසි සැලකිල්ලකින් තොරව වාර්තා කිරීමෙන් ඔවුන් හිරිහැරවලට, කොන් කිරීම්වලට, සමාජයේ දැඩි පිරික්සුමට සහ පළිගැනීම්වලට ලක් විය හැක.[3] මාධ්‍ය වාර්තාකරණයන්ට එවැනි පුද්ගලයින් පිළිබඳව මහජනතාව තුළ පවතින අවබෝධය සහ වගවීම පුළුල් කළ හැක. එසේ නැතිනම්,  වාර්තාකරණයන් ඔස්සේ අගතිගාමී ආකල්ප තීව්‍ර කොට,  වළක්වා ගත හැකි හානිවලට ඔවුන් නිරාවරණය කිරීමට ද හැක. “මහජන අභිලාෂය” වෙනුවෙන් කටයුතු කිරීමේදී මහජනතාව කුතුහලයෙන් පසුවන දෙයට පමණක් අවධානය යොමු කළ නොහැක්කේ එබැවිනි: එනම්, හානිය අවම කිරීම සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයින් ආරක්ෂා කිරීම වැනි වෘත්තීය වගකීම් ඉටුකරන අතරම, යම් ගැටලුවක් අවබෝධ කර ගැනීමට මහජනතාවට සැබවින්ම උපකාරී වන කරුණු පමණක් පළ කිරීම කර්තෘ සතු මහඟු වගකීමකි.[4]

## මාධ්‍යයේ බලපෑම

පුවත්පත් ආයතන විසින් දිනපතා අවධානය යොමු කළ යුතු පුවත් තෝරා ගැනීම (න්‍යාය පත්‍ර සැකසීම - Agenda-setting) සහ එම පුවත් ඉදිරිපත් කරන ආකාරය (රාමුගත කිරීම - Framing) පිළිබඳ තීරණ ගනු ලබයි.[5] මෙම තීරණ ඉතා වැදගත් වේ: මහජනතාවගේ අවධානය යොමු වන කරුණු, පොදුවේ ඔවුන් සිතන ආකාරය මෙන්ම විශේෂිත සිදුවීම් සහ ගැටලු ඔවුන් අවබෝධ කරගන්නා ආකාරය ද හැඩගස්වනු ලබන්නේ මේ හරහා ය.[6]

මෙම අත්පොතෙහි විස්තර කෙරෙන අනන්‍යතා කණ්ඩායම්වලට මෙවැනි තීරණවල ඵලවිපාක සැබෑ ජීවිතයේ අත්විඳීමට සිදු විය හැක. ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ ගැහැණු දරුවන්, LGBTQIA+ පුද්ගලයින් සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ පුද්ගලයින්/වින්දිතයින් සඳහා බොහෝ විට මාධ්‍ය තුළ ප්‍රමාණවත් ඉඩක් නොලැබෙන අතර, ඔවුන් නිෂේධනාත්මක ඒකාකෘති (Negative stereotypes) හරහා නිරූපණය කිරීම ද බොහෝ විට නිරීක්ෂණය වේ. එමෙන්ම, ඔවුන් පිළිබඳ සැබෑ තත්ත්වය පිළිබිඹු නොවන අයුරින් ඔවුන් නිරූපණය කිරීම ද බොහෝ විට දක්නට ලැබේ. මාධ්‍ය විසින් ඇතැම් ආඛ්‍යානයන් (ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන කාන්තාවන් පිළිබඳව භාවාතිශය වාර්තා කිරීම් සහ

1 UNESCO සංවිධානය, මාධ්‍ය සංවර්ධනය පිළිබඳ උපායමාර්ගික සංවාදය විසින් ප්‍රජාතන්ත්‍රවාදය සහ දේශපාලන සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමෙහිලා ජනමාධ්‍ය සතු කාර්යභාරය ස්ථිර කෙරේ (2023) (*Strategic Dialogue on Journalism Development Affirms Role of Journalism in Promoting Democracy and Political Participation* (2023)) <https://www.unesco.org/en/articles/strategic-dialogue-journalism-development-affirms-role-journalism-promoting-democracy-political > ප්‍රවේශය 2026 පෙබරවාරි 15

2 වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය (Society of Professional Journalists), *ආචාරධර්ම පද්ධතිය* (1973) < https://www.spj.org/wp-content/uploads/2024/08/spj-code-of-ethics.pdf> ප්‍රවේශය 2026 පෙබරවාරි 19

3 කොළඹ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය සහ FOKUS WOMEN, වාර්තාව: ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2017) හරහා ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයට අදාළ අවමානය පිටුදැකීම  (Tackling Stigma of Conflict Related Sexual Violence through the Sri Lanka National Action Plan on Sexual and Gender-Based Violence (2017) < PSVI වාර්තාව ශ්‍රී ලංකාවේ > ප්‍රවේශය 2026 අප්‍රේල් 6 https://assets.publishing.service.gov.uk/government/uploads/system/uploads/attachment_data/file/645640/SV_Workshop_Report_-_Sri_Lanka.pdf ප්‍රවේශය 2026 පෙබරවාරි

4 එම.

5 මැක්ස්වෙල් මැකොම්බ්ස් සහ ඩොනල්ඩ් ෂෝ, ජනමාධ්‍යයේ න්‍යාය පත්‍ර සැකසීමේ කාර්යය (The Agenda-Setting Function of Mass Media) (1972) 36 පබ්ලික් ඔපීනියන් ක්වෝටලි (Public Opinion Quarterly) 176.

6 එම.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

LGBTQIA+ අනන්‍යතාවන් සමාජ අපවාදයට ලක් වන ආකාරයෙන් නිරූපණය කිරීම) නැවත නැවතත් ඉස්මතු කරනු ලබන අතරවාරයේදී, අනෙකුත් ආඛ්‍යානයන් සඳහා (කාන්තාවන්ගේ විශේෂඥභාවය සහ නායකත්වය, LGBTQIA+ පුද්ගලයින්ගේ එදිනෙදා ජීවිතයේ යථාර්ථය හෝ ව්‍යුහාත්මක වශයෙන් ඔවුන් සමාජය තුළ කොන් කරනු ලබන ආකාරය පිළිබඳ වාර්තාකරණයන් ද ඇතුළුව) සීමිත ඉඩක් ලබා දීම ද නිරීක්ෂණය වේ. මෙය, මෙම ප්‍රජාවන් පිළිබඳවත්, ඔවුනට සැබවින්ම පවතින හෝ වහා පිළියම් යෙදීම අවශ්‍ය වන ගැටලු කවරේ ද යන්න පිළිබඳවත් මහජනතාව අතර ගොඩනැගෙන මතය කෙරෙහි බලපෑමක් ඇති කරයි.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය ක්ෂේත්‍රය තුළ මෙම රටාවන් පැහැදිලිව නිරීක්ෂණය වේ. අපරාධ සහ විනෝදාස්වාදය සම්බන්ධ පුවත් තුළ කාන්තාවන් පිළිබඳව නිතර සඳහන් වුව ද, ඔවුන් බොහෝ විට නිෂේධනාත්මක ඒකාකෘති හරහා නිරූපණය වීම දක්නට ලැබේ. සාමාන්‍යයෙන් කාන්තාවක් විපතට පත් වූවන් ලෙස හෝ දුෂ්ටයින් ලෙස හෝ නිෂේධනාත්මක ඒකාකෘති හරහා හෝ නිරූපණය කෙරෙන අතර, දේශපාලනය, විද්‍යාව සහ ව්‍යාපාරික වාර්තාකරණයන් තුළ ඔවුන් ඉස්මතු කොට දැක්වෙනුයේ ඉතා අඩු වශයෙනි. මේ අතර, LGBTQIA+ අනන්‍යතාවන් සහිත පුද්ගලයින් බොහෝ විට දක්නට ලැබෙන්නේ ඔවුන්ගේ අනන්‍යතාව භාවාතිශය ලෙස දක්වන (Sensationalise), ඔවුන්ගේ ස්වයං ප්‍රකාශනයට සමච්චල් කරන, හෝ ඔවුන්ගේ ජීවිත සදාචාරාත්මක පරිහානියේ හෝ විකෘතිතාවයේ සලකුණු ලෙස හුවා දක්වන පුවත්වල පමණි. මෙම නිරූපණයන් එම ප්‍රජාවන් දෙකෙහිම පවතින සම්පූර්ණ යථාර්ථය පිළිබිඹු නොකරන නමුත්, මහජනයා ඔවුන්ව ඇසුරු කරන සහ තේරුම් ගන්නා ආකාරය කෙරෙහි ඒවා බලපෑම් කරයි.

පුවත් ආවරණය කිරීමේදී නැවත නැවතත් නිරීක්ෂණය වන රටාවන් හඳුනා ගැනීමටත්, වෘත්තීය මට්ටමින් විමසා බලා තීරණ ගැනීමේ හැකියාව ශක්තිමත් කිරීමටත් මාධ්‍යවේදීන්ට පරිශීලනය කළ හැකි මාර්ගෝපදේශයක් ලෙස මෙම අත්පොත සැකසී ඇත. වාර්තාකරණය නිවැරදිව සහ සාධාරණව මෙන්ම එකී පුවත්වලට අදාළ පුද්ගලයින් පිළිබඳව ගෞරවයක් හඟවන අයුරින් ද පවත්වා ගෙන යාමට ඊට දායක විය හැක. මෙම මාර්ගෝපදේශය මාධ්‍ය වෘත්තිකයින් මුහුණ දෙන පීඩනයන් පදනම් කරගෙන සකස් කර ඇති අතර, දැඩි කාලසීමාවන් යටතේ වුව ද අඛණ්ඩව ප්‍රමිතීන් පවත්වා ගැනීමට සහ වළක්වා ගත හැකි හානි අවම කර ගැනීමට උපකාරී වන ප්‍රායෝගික මෙවලම් සපයයි.

## මෙම අත්පොතේ අරමුණ

මෙම අත්පොත වෘත්තීය ජනමාධ්‍යකරණයට රුකුලක් වශයෙන් ඉදිරිපත් කෙරේ. ශ්‍රී ලංකාවේ මාධ්‍ය තුළ කාන්තාවන් සහ ගැහැණු දරුවන් මෙන්ම LGBTQIA+ පුද්ගලයින්ට අදාළ වාර්තාකරණය හේතුවෙන් ඔවුන් වෙත නැවත නැවතත් අහිතකර බලපෑම් එල්ල වන අතර, ඒ හේතුවෙන් එම අනන්‍යතා කණ්ඩායම් දෙක කෙරෙහි මෙම අත්පොත අවධානය යොමු කරයි. මෙම අත්පොත දැනට පවතින ආචාරධර්ම පද්ධතීන් වෙනුවට භාවිතා කිරීමේ අරමුණින් හඳුන්වා දෙන්නක් නොවේ. ඒ වෙනුවට, ශ්‍රී ලංකාව තුළ දැනටමත් පිළිගෙන ඇති මූලික ප්‍රතිපත්ති මෙරටින් හමු වන උදාහරණ භාවිතයෙන් විස්තර කරමින්, එදිනෙදා ප්‍රායෝගික භාවිතය සඳහා අනුගමනය කළ හැකි මාර්ගෝපදේශ මේ තුළින් ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාව දැනටමත් පරිශීලනය කරන ජනමාධ්‍ය ආචාරධර්ම රාමු කිහිපයක් පවතින නමුත්, ඒවා බොහෝ දුරට විශේෂිත නොවන, යාවත්කාලීන නොකරන ලද රාමු වේ. එමෙන්ම, කාන්තාවන් හෝ LGBTQIA+ ප්‍රජාවන් පිළිබඳ වාර්තාකරණයේදී අනුගමනය කළ යුතු විශේෂිත මාර්ගෝපදේශයන් එහි ඇතුළත් නොවේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, ලිංගික අපරාධ, හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාව සහ ලිංගික දිශානතිය සම්බන්ධ පුවත්වලට අදළ වාර්තාකරණයේදී මෙම අඩුපාඩු වඩාත් පැහැදිලිව දක්නට ලැබේ.

## මාධ්‍ය තුළ නිරතුරුව දක්නට ලැබෙන ගැටලුකාරී වාර්තාකරණ රටා

සිංහල මාධ්‍ය නිරීක්ෂණය කිරීමේදී, විශේෂයෙන්ම වෙරිටේ රිසර්ච් (Verité Research) ආයතනයේ මාධ්‍ය සහ දේශපාලන අංශය යටතේ ක්‍රියාත්මක වන "එතික්ස් අයි" (Ethics Eye - ආචාරධාර්මික නොවන සහ ගැටලුකාරී වාර්තාකරණයන් ඉදිරිපත් කරනා මාර්ගගත පර්යන්තය) හරහා සිදු කරන ලද නිරීක්ෂණවලට අනුව, ආචාරධර්ම ආශ්‍රිත ගැටලු මතු කරන, කඩිනම් අවධානය යොමු කළ යුතු ප්‍රධාන වාර්තාකරණ රටාවන් තුනක් මෙම අත්පොත සැකසීමේදී හඳුනාගෙන ඇත.[7]

a. නිෂේධනාත්මක, හානිකර සහ සැබෑ තත්ත්වය පිළිබිඹු නොකරන ඒකාකෘති

ඇතැම් පුවත් වාර්තාකරණයන් නිෂේධනාත්මක ඒකාකෘති මත පදනම් වීම නිරීක්ෂණය වන අතර, යම් පුද්ගලයෙකු පිළිබඳ සත්‍ය කරුණු දැන ගැනීමට පෙර ඔවුන් පිළිබඳව පාඨකයා තුළ පූර්ව නිගමනයක් ඇති කිරීමට මෙය හේතු වේ. විශේෂයෙන්ම හැඟීම් කළඹවනසුළු අපරාධ පුවත්වලදී කාන්තාවන් බොහෝ විට ගෙදරදොර වැඩ කටයුතු හෝ

7 වෙරිටේ මීඩියා (Verité Media), 'එතික්ස් අයි (Ethics Eye)' < www.facebook.com/ethicseye/?_rdc=1&_rdr#> ප්‍රවේශය 2026 පෙබරවාරි 17

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

“ගෞරවනීය” යැයි සම්මත රාමුවලට පමණක් සීමා කෙරෙනු දැකිය හැක.[8] මේ අතර, LGBTQIA+ පුද්ගලයින් පිළිබඳව වාර්තා කිරීමේදී ඔවුන් කොන් කිරීමට ලක් විය හැකි ආකාරයේ වාර්තාකරණ රටාවන් නිරීක්ෂණය වේ. තව ද, පුවතට සෘජුවම අදාළ නොවන අවස්ථාවලදී පවා LGBTQIA+ පුද්ගලයින්ගේ පෙනුම හෝ අනන්‍යතාව පිළිබඳව අනවශ්‍ය අවධානයක් යොමු කිරීම හරහාත්, “අස්වාභාවික” හෝ “අසාමාන්‍ය” වැනි වචන හරහා නින්දාසහගත ලෙස දක්වමින් “අන්‍යකරණයට” (Othering) ලක් කිරීම හරහාත් ඔවුන් නිතරම කොන් කෙරෙන බව ද දැකිය හැක.[9]

b. කම්පනයට පත් වූ සිදුවීම් සුළු කොට වාර්තා කිරීම

දේශීය මාධ්‍ය විසින් කාන්තාවන්ට සහ ගැහැණු දරුවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය, විශේෂයෙන්ම ලිංගික හිංසනයන් හෝ අපයෝජනයන්ට අදාළ සිදුවීම් බොහෝ විට සුළු කොට වාර්තා කිරීම දැකිය හැක.[10] ගැහැණු දරුවන් සම්බන්ධ ලිංගික ප්‍රචණ්ඩත්වය විස්තර කිරීමේදී භාවිතා කරන ව්‍යංගාර්ථ හරහා සිදුවීමේ බරපතලකම පිළිබඳව ප්‍රේක්ෂකයා තුළ පවතින සංවේදීතාව අඩුවීමටත්, ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට තමන්ගේ ආරක්ෂාව, සෞඛ්‍යය සහ යුක්තිය ඉටුකර ගැනීම සඳහා වන සේවාවන් වෙත යොමු වීම දුෂ්කර කිරීමටත් හේතු විය හැකිය. එමෙන්ම කාන්තාවන් සහ බාලවයස්කාර දරුවන් පිට වරද පැටවීමේ ස්වරූපයෙන් පුවත් වාර්තා කිරීම ද (Blame-shifting framing) බහුලව දක්නට ලැබේ.

c. භාෂාව හරහා සමාජ අපවාදයන්/කැලැල් (Stigma) තහවුරු කිරීම හෝ පවත්වාගෙන යාම

නිෂේධනාත්මක ඒකාකෘතිකරණයට අමතරව, අපරාධයන්ට මුහුණ දුන් පුද්ගලයින් “ලැජ්ජා විය යුතු” හෝ, එසේත් නැතිනම් මනුෂ්‍යයින් වශයෙන් ඔවුන්ට හිමි වටිනාකම අඩු වූ පිරිසක් ලෙස හඳුන්වා දෙන භාෂා භාවිතය ද මෙරට මාධ්‍ය වාර්තාකරණයන් තුළ ඇතැම් විට දක්නට ලැබේ. නිදසුනක් ලෙස, සිංහල මාධ්‍ය වාර්තාකරණයේදී ලිංගික අපරාධයක් හෝ ලිංගික අපයෝජන සිදුවීමක් විස්තර කිරීමට “දූෂණය” හෝ “කෙලෙසීම” වැනි වචන නිතර භාවිතා කෙරේ. අදාළ පුද්ගලයා “කිලිටි වී ඇති” හෝ “දූෂිත” බව මෙම වචන මගින් හඟවන අතර, එමගින් සිදුවූ අපරාධය කෙරෙහි තිබිය යුතු අවධානය, අපරාධයට මුහුණ දුන් පුද්ගලයාගේ “පවිත්‍රත්වය අහිමි වීම” කෙරෙහි යොමු කෙරේ.

එවැනි පුවත් ඒ අයුරින් රාමුගත කිරීම මගින් ලැජ්ජාව තවදුරටත් තීව්‍ර කෙරෙන අතර, ඒ හේතුවෙන් අපරාධයට මුහුණ දුන් පුද්ගලයින් සිදුවීම වාර්තා කිරීමට මැලි විය හැක. එපමණක් නොව, ඔවුනට තවදුරටත් මානසික හානි ඇති කිරීමට ද එය හේතු විය හැක. ඒ හා සමානව, සමලිංගික සබඳතා පවත්වන පිරිමින් හට අපහාස කිරීම සඳහා “සමනළයා” වැනි නිග්‍රහාත්මක වචන භාවිතා වීම ද දක්නට ලැබේ. මෙවැනි භාෂා භාවිතයන් මගින් සත්‍ය කරුණු විස්තර නොකෙරේ; ඒ වෙනුවට එමගින් පුද්ගලයින්ගේ අනන්‍යතාව සමච්චලයට ලක් වන අතර ඒ මත පුද්ගලයින් කොන් කිරීම ගැටලුවක් නොවන බවට සමාජයට පණිවිඩයක් ලබා දෙයි.

මෙම රටාවන් මගින් පවත්නා අගතීන් තහවුරු වන අතර, එමගින් අන්තර්ජාලය තුළ මෙන්ම ඉන් බැහැරව ද අදාළ පුවතට පාදක වන පුද්ගලයින් හිරිහැරයට සහ සමාජ අපවාදයට ලක් විය හැක. ඔවුන්ගේ කීර්ති නාමයට හානි වී දිගුකාලීන මානසික පීඩාවන් ද ඇතුළු හානිවලට ද ඔවුන් නිරාවරණය විය හැක. ඒ අනුව, මෙම අඩුපාඩු සෘජුවම විසඳීමේ අපේක්ෂාවෙන් මෙම අත්පොත නිර්මාණය කර ඇත. එහි අරමුණ සරල ය: එනම් වාර්තාකරුවන්, උපකර්තෘවරුන්, කර්තෘවරුන්, මාධ්‍ය උපදේශකවරුන්, කාටූන් ශිල්පීන් සහ අන්තර්ජාල පුවත් අංශ වෙත, දැඩි කාලසීමාවන් යටතේ වුව ද ඉහළ වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගැනීමට උපකාරී වන, ඉක්මණින් යොදා ගත හැකි ප්‍රායෝගික මාර්ගෝපදේශ මාලාවක් ලබා දීමයි. ඒ පිටුපස ඇති මූලික ප්‍රතිපත්තිය වන්නේ වාර්තාකරණයේදී සිදුවන හානිය අවම කිරීමයි.

8 වෙරිටේ මීඩියා (Verité Media), ‘මේ පුවත ඔබ ගැන නම් ඔබ එය අනුමත කරනවා ද?’ (ෆේස්බුක්, 2024 මාර්තු 20) < www.facebook.com/ethicseye/posts/pfbid0rEQYeBL2QbjUfhdvxRBVShd6S1tsuGVePV81R3gz4Pg2mdrY5WsMYCeKC3868b6Ml > ප්‍රවේශය 2026 පෙබරවාරි 19; වෙරිටේ මීඩියා (Verité Media), ‘මවක් තම බිළිඳා ඝාතනය කිරීම පිළිබඳ පුවතක්: හැඟීම් කළඹවනසුළු වාර්තාකරණය.’ (ෆේස්බුක්, 2024 සැප්තැම්බර් 27)

9 වෙරිටේ මීඩියා (Verité Media), ‘මියගිය තැනැත්තාගේ ඇඳුම් පැළඳුම් ප්‍රවෘත්තියට අදාළ ද?’ (ඉන්ස්ටාග්‍රෑම්, 2024 පෙබරවාරි 9) < www.instagram.com/p/C3XuPEBBkk6/> ප්‍රවේශය 2026 පෙබරවාරි 19; වෙරිටේ මීඩියා (Verité Media), ‘“අස්වාභාවික හැසිරීම්” ගැන සඳහන් කරමින්, ව්‍යවස්ථාපිත ලිංගික අපරාධය මගහැරීම.’ (ඉන්ස්ටාග්‍රෑම්, 2024 පෙබරවාරි 15) < www.instagram.com/p/C3XuPEBB-kk6/ > ප්‍රවේශය 2026 පෙබරවාරි 19; වෙරිටේ මීඩියා (Verité Media), ‘ගැහැණු ළමයෙකු බර ඉසිලීමේ ඇති අන්තගාමීත්වය කුමක් ද?’ (ඉන්ස්ටාග්‍රෑම්, 2024 මාර්තු 28)

10 වෙරිටේ මීඩියා (Verité Media), ‘“අමුතු ඉංග්‍රීසි” නොව ලිංගික හිංසනයයි’ (ඉන්ස්ටාග්‍රෑම්, 2023 දෙසැම්බර් 11), < www.instagram.com/p/C0ttNyShfkI/?igsh=MW42cjV0Y3locWs4dA%3D%3D > ප්‍රවේශය 2026 පෙබරවාරි 19; එතික්ස් අයි (Ethics Eye), ‘අමුතු පාඩමක් ද නැතහොත් ලිංගික හිංසනයක් ද?’ (වෙරටේ මීඩියා, ෆේස්බුක්, 2024 පෙබරවාරි 12) < www.facebook.com/story.php?story_fbid=365741132883822&id=100083438136844&rdid=VGTH3y2gLfiQNcdV> ප්‍රවේශය 2026 පෙබරවාරි 19

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## මෙම අත්පොත මගින් ආවරණය කෙරෙන කරුණු

ඉදිරි පරිච්ඡේද මගින් මෙම රටාවන්ට පිළියම් යෝජනා කරනු ලබන අතර, වෘත්තීය මට්ටමින් විමසා බලා තීරණ ගැනීම වඩාත් වැදගත් වන — සහ එසේ නොමැති වාර්තාකරණයන් නිසා හානි සිදුවීමට වැඩි ඉඩක් ඇති — වාර්තාකරණ තේමා තුනක් කෙරෙහි එහිදී අවධානය යොමු කෙරේ.

1. **ස්ත්‍රී පුරුෂ සමාජභාවීය නියෝජනය පිළිබඳ වාර්තාකරණය:** ජන ජීවිතය තුළ, වෘත්තීය සන්දර්භයන් තුළ සහ එදිනෙදා පුවත් වාර්තා කිරීමේදී කාන්තාවන් සහ ගැහැණු දරුවන් නිරූපණය කෙරෙන ආකාරය.

2. **ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාව පිළිබඳ වාර්තාකරණය:** LGBTQIA+ අනන්‍යතාවන් විස්තර කරනු ලබන ආකාරය, එම අනන්‍යතාව පුවතට අදාළ වන මෙන්ම අදාළ නොවන අවස්ථා, සහ භාෂාව මෙන්ම දෘශ්‍ය මාධ්‍ය ද කරුණු අවබෝධ කරදීමට මෙන්ම පුද්ගලයින් අවමානයට ලක් කිරීමට ද යොදා ගන්නා අයුරු.

3. **ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තාකරණය:** විශේෂයෙන්ම ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ පුද්ගලයින් දැඩි ලෙස සමාජ අපවාදයට ලක් වන අවස්ථාවලදී මෙන්ම ආචාරධාර්මික නොවන වාර්තාකරණයන් මගින් ඔවුන් නැවත කම්පනයට පත් විය හැකි, සමාජයට නිරාවරණය විය හැකි හෝ යුක්තිය ඉටු වීමට බාධා පැමිණවිය හැකි අවස්ථාවලදී ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳව වගකීම්සහගත වාර්තාකරණයක නියැලෙන ආකාරය. මෙම මාර්ගෝපදේශ කාන්තාවන්, ගැහැණු දරුවන් සහ LGBTQIA+ පුද්ගලයින් සම්බන්ධ වාර්තාකරණයේදී අදාළ වන අතරම, ලිංගික ප්‍රචණ්ඩත්වය සෑම ස්ත්‍රී පුරුෂ සමාජභාවයකටම අයත් පුද්ගලයින්ට බලපෑ හැකි බවත්, ඊට ගොදුරු වූ පුද්ගලයින් හට පුවත් වාර්තාකරණය හරහා හානි සිදුවීම වළක්වා ගත යුතු බවත් මෙහිදී පිළිගනු ලබයි.

## මෙම අත්පොත සම්පාදනය කිරීමේදී අනුගමනය කළ ක්‍රමවේදය

මෙම අත්පොතෙහි ඇතුළත් නිර්දේශයන් සැකසීමේදී ක්‍රියාමාර්ග හතරක් අනුගමනය කර ඇත:

- *ශ්‍රී ලංකාවේ මාධ්‍ය තුළ නිරීක්ෂණය වන ආචාරධාර්මික නොවන වාර්තාකරණ රටාවන් හඳුනා ගැනීම*

වෙරිටේ මාධ්‍ය හා දේශපාලන අංශයෙහි "එතික්ස් අයි" (Ethics Eye) පර්යන්තය මගින් 2016 වසරේ සිට සිංහල මාධ්‍ය තුළ සිදුවන ආචාරධාර්මික නොවන සහ ගැටලුකාරී වාර්තාකරණයන් ඉදිරිපත් කර ඇත. එමගින් කාන්තාවන්, ගැහැණු දරුවන්, LGBTQIA+ පුද්ගලයින් සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්/වින්දිතයින් පිළිබඳ වාර්තා කිරීමේදී අඛණ්ඩව සිදුවන හානිකර රටාවන් හෙළිදරව් කර ඇත.

වසර දෙකක (2022 සිට 2023 දක්වා) දත්ත විශ්ලේෂණයන්ට අනුව, අපරාධ වාර්තාකරණය භාවාතිශය ලෙස ඉදිරිපත් කිරීම (Sensationalised), සෘණාත්මක ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ඒකාකෘති (Negative gender stereotypes) සහ LGBTQIA+ පුද්ගලයින් පිළිබඳ වැරදි නිරූපණයන් වැනි රටාවන් හඳුනාගෙන ඇත. මෙම සොයාගැනීම් මගින් එදිනෙදා වාර්තාකරණයේදී සිදුවන වැරදි සහ වඩාත්ම වෙනස් විය යුතු ක්ෂේත්‍ර පිළිබඳව ශ්‍රී ලංකාවට ආවේණික වූ සාක්ෂි සපයනු ලැබේ.

- *ශ්‍රී ලංකාවේ මාධ්‍ය සදාචාර ප්‍රමිතීන් පිළිබඳ මූලධර්ම සමාලෝචනය කිරීම*

මෙම අත්පොත ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ආචාරධර්ම පද්ධතිය (1981), කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව (2000) සහ මෙරට සකස් කරන ලද අනෙකුත් ආචාරධර්ම පද්ධතීන් සහ ප්‍රඥප්තීන් ඇතුළු දැනට පවතින දේශීය ප්‍රමිතීන් මත පදනම් වී ඇත.[11] වාර්තාකරණය තුළ කිසිවෙකු කොන් නොකිරීම, පෞද්ගලිකත්වය සුරැකීම සහ සංවේදීතාව යන කරුණු අවධාරණය කරන, ශ්‍රී ලංකාවටම විශේෂිත වූ රාමුවක් සඳහා අවශ්‍ය පදනම මෙම ආචාරධර්ම පද්ධතීන් මගින් සකසනු ලබයි. කෙසේ වෙතත්, ඒවා ඇතැම් විට යල් පැන ගිය ඒවා වේ, නැතහොත් අඛණ්ඩව ක්‍රියාත්මක නොවේ, නැතිනම් ඒවායේ විෂය පථය සීමිතය; එබැවින් කාන්තාවන්, ගැහැණු දරුවන් සහ LGBTQIA+ පුද්ගලයින් පිළිබඳ වාර්තාකරණය සම්බන්ධයෙන් ඉන් ලබා දෙන්නේ ඉතා අවම නිශ්චිත මගපෙන්වීමකි.

11 ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය, මාධ්‍යවේදීන් සඳහා වූ ආචාරධර්ම පද්ධතිය (1981) < www.mediareform.lk/wp-content/uploads/2020/01/20-Sri-Lanka-Press-Council-setting-out-of-Code-of-Ethics-for-Journalists.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19; ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම විසින් පිළිගන්නා ලද ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව (ආචාර ධර්ම පද්ධතිය) (2000) < www.fmmsrilanka.lk/wp-content/uploads/2019/05/2016-Code-of-Professional-Practice_Eng.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

- *ජාත්‍යන්තර ප්‍රමිතීන්වලින් උපුටා ගත් යහපත් භාවිතයන් යොදා ගැනීම*

ජාත්‍යන්තර සම්මතයන් ද මෙම අත්පොත සැකසීමට දායක වී ඇත. නිදසුනක් ලෙස, වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ (Society of Professional Journalists) ආචාරධර්ම පද්ධතිය මගින් "හානිය අවම කිරීමේ" වගකීම සහ සෑම පුද්ගලයෙකුටම "ගරු කළ යුතු මනුෂ්‍යයින් ලෙස" සැලකීමේ අවශ්‍යතාව අවධාරණය කරයි.[12] විශේෂයෙන්ම ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ පුද්ගලයින් කේන්ද්‍ර කරගත් වාර්තාකරණය සහ භාෂාව භාවිතා කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ ගෝලීය පුවත් සංවිධානවලින් ලැබුණු මාර්ගෝපදේශ, ශ්‍රී ලංකාවේ සංස්කෘතියට සහ නීතිමය පරිසරයට ගැලපෙන පරිදි තෝරාගෙන අනුවර්තනය කරන ලදි. එම මාර්ගෝපදේශ දැනට ශ්‍රී ලංකාවේ පවතින මාධ්‍ය ආචාරධර්ම ප්‍රමිතීන් තවදුරටත් ගොඩනැංවීම සඳහා යොදා ගෙන ඇත.

- *ශ්‍රී ලංකාවේ මාධ්‍ය වෘත්තිකයින්ගේ අදහස් අවබෝධ කර ගැනීම*

කර්තෘවරුන්, වාර්තාකරුවන්, ක්‍රියාකාරීන්, විද්වතුන් මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගිකත්වය සහ ප්‍රචණ්ඩත්වය යන විෂයයන් පිළිබඳ දිනපතා කටයුතු කරන නීති සහ සෞඛ්‍ය වෘත්තිකයින් සමඟ පවත්වන ලද සාකච්ඡා මෙම මාර්ගෝපදේශයේ අන්තර්ගතය සැකසීමට දායක වී ඇත . ඔවුන්ගේ අදහස් මගින් භාෂා භාවිතය, දෘශ්‍ය නිරූපණයන්, අපරාධ පුවත් රාමුගත කිරීම (Framing) මෙන්ම මුද්‍රිත, රූපවාහිනී සහ අන්තර්ජාල අන්තර්ගතයන් අතර පවතින වෙනස්කම් ඇතුළු නැවත නැවතත් ගැටලු පැනනගින ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීමට හැකියාව ලැබිණි. එබැවින්, වර්තමාන මාධ්‍ය භාවිතයේ පවතින වඩාත්ම දැවෙන ගැටලු වශයෙන් වෘත්තිකයින් විසින්ම හඳුනාගත් ගැටලු මෙම අත්පොත තුළින් පිළිබිඹු වන අතර එය ඔවුන්ට එදිනෙදා කටයුතුවලදී ප්‍රයෝජනවත් වීමේ අරමුණ ඇතිව සම්පාදනය කර ඇත.

## හානිය අවම කිරීම: මෙම මාර්ගෝපදේශවලට පාදක වී ඇති මූලික ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ LGBTQIA+ ප්‍රජාවන් පිළිබඳ වාර්තාකරණය යනු බොහෝ විට සමාජ අපවාදය, කම්පනය (Trauma), ප්‍රචණ්ඩත්වය, අසමානාත්මතාව සහ සමාජීය අවදානම වැනි තත්ත්වයන් පවතින ක්ෂේත්‍ර සමඟ කටයුතු කිරීමට සිදුවීමයි. මෙම සන්දර්භය තුළ, මෙම අත්පොත මෙහෙයවනු ලබන ප්‍රධාන වෘත්තීමය බැඳීම වන්නේ වාර්තාකරණය මගින් සිදුවන හානිය අවම කිරීමේ වගකීමයි.

හානිය අවම කිරීම යනු දුෂ්කර පුවත් වාර්තා කිරීමෙන් වැළකී සිටීම හෝ පුවත්වල බරපතලකම අඩු කිරීම නොවේ. යම් පුවතක් රාමුගත කරන (Framing), එකී පුවත ලියන සහ නිරූපණය කරන ආකාරය අනුව ඊට අදාළ පුද්ගලයින්ට රැකවරණය සැලසීමට මෙන්ම, අනෙක් අතට, ඔවුන් මුහුණ දෙන හානිය තවදුරටත් තීව්‍ර කිරීමට ද හැකි බව වටහා ගනිමින්, එම පුද්ගලයින් සමඟ වගකීමෙන් යුතුව, දයාවෙන් කටයුතු කිරීම එයින් අදහස් කෙරේ. වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය පවසන පරිදි, "ආචාරධාර්මික  ජනමාධ්‍යකරණය ගෞරවය ලැබිය යුතු මනුෂ්‍යයින් ලෙස මිනිසුන්ට සලකයි".[13]

සිදුවිය හැකි බලපෑම සැලකිල්ලට නොගෙන සිදු කරනු ලබන වාර්තාකරණයන් හේතුවෙන්, කාන්තාවන් සහ LGBTQIA+ ප්‍රජාවන්ගේ නම්, ඡායාරූප හෝ විස්තර ඇතැම් විට ප්‍රමාණවත් සැලකිල්ලකින් තොරව යම් පුවතක පළ විය හැක. මෙමගින් ඔවුන් හිරිහැරවලට සහ සෝදිසියට (Surveillance) භාජනය විය හැකි අතර, ඔවුන් පවුලෙන් කොන් වීමටත්, ඔවුන්ගේ රැකියා අහිමි වීමටත් එය හේතු විය හැක. එමෙන්ම, ඔවුන් එමගින් ශාරීරික ප්‍රචණ්ඩත්වයට පවා නිරාවරණය විය හැක. එබැවින්, මෙම වගකීම ශ්‍රී ලංකාව තුළ විශේෂයෙන් වැදගත් වේ.

මෙම වගකීම හා බැඳුණු, අත්පොතෙහි සෙසු කොටස් මෙහෙයවනු ලබන මූලධර්ම තුනක් පවතී.

- *වෘත්තීය මට්ටමින් තීරණ ගැනීමේදී අගතිගාමී වීම වෙනුවට, දයානුකම්පාව සහ සහකම්පනය පදනම් කරගැනීම*

දයානුකම්පාව බොහෝ විට විෂයමූලිකත්වයට (Objectivity) ඇති තර්ජනයක් ලෙස වැරදියට වටහා ගනු ලැබේ.[14] කෙසේ වෙතත්, තහවුරු කරන ලද කරුණු මත පදනම් වූ විට එය ආචාරධාර්මික තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කරයි. අනවශ්‍ය හානියක් සිදු නොකර, පුවතකට ඇතුළත් කළ යුතු දේ, ඉවත් කළ යුතු දේ සහ පුවත රාමුගත කළ යුතු ආකාරය තීරණය කිරීමට එය මාධ්‍යවේදීන්ට උපකාර කරයි.

ප්‍රායෝගික පුවත්පත් කටයුතුවලදී, සරල ප්‍රශ්නයක් යොදා ගනිමින් දයානුකම්පාවට ඉඩ දිය හැක:

12 වෘත්තීය මාධ්‍යවේදීන්ගේ සංගමය (Society of Professional Journalists), ආචාරධර්ම පද්ධතිය (Code of Ethics) (1973) < https://www.spj.org/wp-content/uploads/2024/08/spj-code-of-ethics.pdf> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

13 එම.

14 මාධ්‍ය ආචාරධර්ම සඳහා වන මධ්‍යස්ථානය (Centre for Journalism Ethics), 'නිර්පාක්ෂික ජනමාධ්‍යකරණයක් තුළ සානුකම්පිතභාවය ප්‍රගුණ කිරීම' (Practicing Compassion in an Unbiased Journalism) (විස්කොන්සින්-මැඩිසන් විශ්වවිද්‍යාලය, 2008) https://ethics.journalism.wisc.edu/2019/04/18/practicing-compassion-in-an-unbiased-journalism/ ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

***මෙය මා ගැන හෝ මාගේ ආදරණීයයෙකු ගැන කියැවෙන පුවතක් නම්, එම අවස්ථාවේදීත් මම එය වාර්තා කරන්නේ මේ ආකාරයටම ද?***

එමෙන්ම, දයානුකම්පාව නිවැරදි තොරතුරු මත පදනම් විය යුතුය.[15] කාන්තාවන් හෝ LGBTQIA+ පුද්ගලයින් පිළිබඳ පුවත්වලදී වේදනාකාරී ඡායාරූපයක් හෝ හැඟීම්බර ප්‍රකාශයක් පෙන්වීම පමණක් ප්‍රමාණවත් නොවේ; එම සිදුවීමට හේතු වූ කරුණු මෙන්ම එය යම්කිසි රටාවක් අනුව සිදුවූවක් ද යන වගත්, ඊට අදාළව යම් වෙනසක් සිදු කළ හැකි ද යන්නත් පිළිබඳව ප්‍රේක්ෂකයින් දැනුවත් වීම අවශ්‍ය වේ. දයානුකම්පාව, ගැටලුව තේරුම් ගැනීමට සහ විසඳුම් සෙවීමට උපකාරී වන පැහැදිලි මෙන්ම අදාළ තොරතුරු මත ද පදනම් විය යුතුය. එවැනි පදනමක් නොමැතිව පුවත් වාර්තා කිරීමෙන් පාඨකයින් කම්පනයට, අසරණභාවයට හෝ නොමඟ යෑමට ලක් විය හැක.

- *පෞද්ගලිකත්වය යනු ආචාරශීලීවීම නොව අයිතිවාසිකමකි*

පෞද්ගලිකත්වය යනු හුදු ආචාරශීලී බව නොවේ; එය මූලික ආචාරධාර්මික අපේක්ෂාවකි. ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ පුද්ගලයින්ගේ හෝ LGBTQIA+ පුද්ගලයින්ගේ අනන්‍යතාව ඔවුන්ගේ අනුමැතියකින් තොරව ප්‍රසිද්ධ කිරීමෙන් ඔවුන්ට හානියක් සිදු විය හැකි බැවින් ඔවුන්ට පෞද්ගලිකත්වය අත්‍යවශ්‍ය වේ. ඇමෙරිකා එක්සත් ජනපදයේ අපරාධවල වින්දිතයින් සඳහා වන ජාතික මධ්‍යස්ථානය විසින් සම්පාදිත "පෞද්ගලිකත්වය සහ අභිමානය" පිළිබඳ මාර්ගෝපදේශය අවධාරණය කරන්නේ, නිසි සැලකිල්ලකින් තොරව තොරතුරු අනාවරණය කිරීම මගින් පුද්ගලයින් නැවත කම්පනයට පත් විය හැකි අතර නීතිමය ක්‍රියාවලීන්ට පවා ඉන් බාධා ඇති විය හැකි බවයි.[16]

ආචාරධාර්මිකව ගත් කළ, තොරතුරු ලැබුණු පමණින් එය පළ කිරීම යුක්තිසහගත නොවේ. එබැවින්, මාධ්‍යවේදීන් තමන්ගෙන්ම මෙසේ විමසීම වැදගත් වේ: මෙම තොරතුරු සැබවින්ම මහජනතාවට අවශ්‍ය ද? නැතහොත්, මෙය ඇතුළත් කිරීමෙන් සිදු වන්නේ වෙනත් අයෙකු අපහසුතාවට පත් කරමින් හුදු කුතුහලය පිනවීමක් පමණක් ද?

- *ගෞරවාන්විත බව පිළිබිඹු කරන භාෂාව සහ දෘශ්‍ය රූප යොදා ගැනීම විකල්පයක් නොව සම්මතයකි*

භාෂාව සහ දෘශ්‍ය රූප මගින් පුද්ගලයින් සමාජ අපවාදයට හෝ අමානුෂිකකරණයට ලක්  කළ හැක. අපවිත්‍ර බව, අසාමාන්‍ය බව හෝ දුරාචාරය හඟවන වචන සහ ශරීරය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රකාශනයන් සඳහා හැඟීම් කළඹවන ආකාරයේ දෘශ්‍ය රූප යොදා ගැනීම මගින් ඔවුන් "දෙවන වරටත් වින්දිතයින්" (Second victimisation) විය හැක. එහිදී මාධ්‍ය නිරූපණයන් නිසා තමා හට නැවතත් හානියක් වූ බවක් පුද්ගලයින්ට හැඟේ.[17] මේ හේතුව නිසා, මාධ්‍යවේදීන් මධ්‍යස්ථ, පුවතට අදාළ සහ ගෞරවය හඟවන භාෂා ශෛලීන් සහ දෘශ්‍ය රූප තෝරා ගැනීම වැදගත් වේ. පුද්ගලයින් මාධ්‍ය සංදර්ශන බවට පත් කිරීමකින් තොරව, ඔවුන්ට එල්ල විය හැකි සමාජ අපවාදය තීව්‍ර නොකර, මහජනතාව දැනුවත් කිරීමට එවිට පුවත් වාර්තාකරණයට හැකි වේ. මෙම මූලධර්ම ශ්‍රී ලංකාව තුළ විශේෂ අවධානයක් අවශ්‍ය වන වාර්තාකරණ ක්ෂේත්‍ර තුනක් සඳහා අදාළ කරගන්නා ආකාරය ඉදිරි පරිච්ඡේද මගින් විස්තර කෙරේ. එකී පරිච්ඡේදයන් මගින් නිශ්චිත භාෂා භාවිතයන් සහ ශ්‍රී ලංකාවේ මාධ්‍යවලින් උපුටා ගත් උදාහරණ විස්තර කරනු ලබන අතර, පුවත්පත් ආයතන දෛනිකව මුහුණ දෙන තත්ත්වයන් යටතේ වාර්තාකරණය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික මෙවලම් ද හඳුන්වා දෙනු ලැබේ.

15 එම.

16 අපරාධවල වින්දිතයින් සඳහා වන ජාතික මධ්‍යස්ථානය (National Centre for Victims of Crime), පුද්ගලිකත්වය සහ ගෞරවාන්විතභාවය: මාධ්‍ය සමඟ ගනුදෙනු කිරීම සඳහා මාර්ගෝපදේශයක් (Privacy and Dignity: A Guide to Interacting with the Media) < https://victimsofcrime.org/wp-content/uploads/2025/12/Privacy_and_Dignity_final.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

17 එම.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

# 1 පරිච්ඡේදය: ස්ත්‍රී පුරුෂ සමාජභාවීය නියෝජනය හා සම්බන්ධ වාර්තාකරණය

එදිනෙදා වාර්තාකරණයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව පුද්ගලයින් නිරූපණය කෙරෙන ආකාරය (Gender representation) වෙත මෙම පරිච්ඡේදය මගින් අවධානය යොමු කෙරේ. එනම්, විශ්වසනීයත්වය, අධිකාරය, හැකියාව සහ සමාජ වටිනාකම පිළිබඳ මහජන මතය හැඩගස්වන අයුරින් පුවත් මගින් පුද්ගලයින්, විශේෂයෙන් කාන්තාවන්, නිරූපණය කරනු ලබන ආකාරය වෙත මෙහිදී අවධානය යොමු කරනු ලැබේ. වාර්තාකරණයේදී යමෙකුගේ චරිතවත් බව, හැකියාව හෝ “ගරුකටයුතු බව” සන්නිවේදනය කරන කෙටි යෙදුමක් ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවය යොදා ගත් විට එය හුදෙක් සමාජ ආකල්ප පිළිබිඹු කරන්නක් පමණක් නොව, නොදැනීම එම ආකල්ප තහවුරු කරන භාවිතයක් බවට ද පත් වේ.

දීර්ඝ කාලයක් තිස්සේ පවත්වාගෙන එනු ලබන සම්ප්‍රදායන් (හෝ චර්යාවන්), කෙටි කාලසීමාවන් තුළ කාර්යයන් නිම කිරීමට ඇති අවශ්‍යතාව, දීර්ඝ කාලයක් තිස්සේ අනුගමනය කළ වාර්තාකරණ පුරුදු — සහ ඇතැම් විට යටිසිතේ පවතින අගතීන් (Unconscious bias) — නොදැනීම වාර්තාකරණය තුළ ඉස්මතු විය හැක. ඒ හේතුවෙන් වාර්තාකරණය නොදැනුවත්වම හුරුපුරුදු රටාවන් වෙත යොමු විය හැක: එනම්, කාන්තාවන්ගේ විශේෂඥභාවයට වඩා ඔවුන්ගේ පෙනුම, ගෘහස්ථ භූමිකාවන් හෝ සදාචාරය ඔස්සේ ඔවුන් විස්තර කිරීම; වෘත්තීය ජයග්‍රහණ “ඇය කාන්තාවක් නිසා” පුදුමයට කරුණක් ලෙස රාමුගත කිරීම; සම්මුඛ සාකච්ඡාවලදී අදාළ විෂය කරුණු වෙනුවට විවාහය, දරුවන් රැකබලා ගැනීම හෝ “අවසරය” වැනි කරුණු දෙසට ප්‍රශ්න යොමු කිරීම; නාට්‍යමය ස්වභාවයක් එක් කිරීම සඳහා අපරාධ වාර්තාකරණයේදී කාන්තාවන් විශේෂ කොට දැක්වීම; සහ සමාජ අපවාදයන් තහවුරු කෙරෙන කටවහරේ පවතින කියමන් හෝ ලේබල් භාවිතා කිරීම මෙයට ඇතුළත් වේ.[18] මෙම පුරුදු බොහෝ විට හිතාමතාම සිදු කරන ඒවා නොවන නමුත්, ඒවා ඉතා වැදගත් වේ. මන්දයත්, එමගින් ප්‍රේක්ෂකයින් කාන්තාවන් දෙස බලන ආකාරය පමණක් නොව, කාන්තාවන් සහ ගැහැණු දරුවන් තමන් පිළිබඳවත්, පොදු සහ පෞද්ගලික ජීවිතය තුළ තමන්ට හිමි ස්ථානය පිළිබඳවත් දකින ආකාරය ද හැඩගස්වන බැවිනි.

මෙම සන්දර්භය තුළ හානිය අවම කිරීම යනු දුෂ්කර පුවත් මගහැරීම හෝ විවේචනාත්මක පිරික්සුම ලිහිල් කිරීම නොවේ. විනයගරුකව නිවැරදි වාර්තාකරණයක නිරත වීම ඉන් අදහස් කරනු ලැබේ: එනම්, සමච්චලය වෙනුවට ගෞරවාන්විත බවත්, අවධානය වෙනතකට යොමු කිරීම වෙනුවට අදාළත්වයටත්, අසමාන ප්‍රමිතීන් වෙනුවට සාධාරණත්වයත් තෝරා ගැනීමයි. මෙම රටාවන්ගෙන් අසමාන ලෙස බලපෑමට ලක්වන්නේ කාන්තාවන් සහ ගැහැණු දරුවන් බැවින් මෙම මාර්ගෝපදේශයෙහි ඇතුළත් උදාහරණ ප්‍රධාන වශයෙන් ඔවුනට අදාළ වේ. එනමුත්, පුවත් වාර්තාකරණයේදී මෙම ප්‍රතිපත්ති - එනම්, පුවතක අදාළත්වය සහ සාධාරණ බව - ස්ත්‍රී පුරුෂ සමාජභාවය කුමක් වුව ද, සෑම පුද්ගලයෙකු හා සම්බන්ධයෙන්ම එකලෙස යොදා ගැනීම වැදගත් වේ.

**මූලික ප්‍රතිපත්තිය: කාන්තාවන් මාධ්‍ය තුළ නිරූපණය කිරීමේදී නිෂේධනාත්මක ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ඒකාකෘති තවදුරටත් තීව්‍ර නොකරමු; ඔවුන්ගේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ සමාජ භූමිකාවන් වෙත අනවශ්‍ය ලෙස අවධානය යොමු නොකරමු.**

18 මහාචාර්ය අනුරුද්ධි එදිරිසිංහ සහ කණ්ඩායම, ශ්‍රී ලාංකීය පුවත්පත්වල කාන්තාවන්ගේ සහ ගැහැණු දරුවන්ගේ අස්වාභාවික මරණ පිළිබඳ වාර්තාකරණය (Reportage of Unnatural Deaths of Women and Girls in Sri Lankan Newspapers) (UNFPA ශ්‍රී ලංකා, පොපියුලේෂන් මැටර්ස් (Population Matters) Policy Issue 07, 2018 පෙබරවාරි) < https://srilanka.unfpa.org/sites/default/files/pub-pdf/6.%20PolicyBrief07_English_0.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## 1.1 කාන්තාවන්ගේ වෘත්තීය සුදුසුකම් හෝ තාක්ෂණික නිපුණතාව හෑල්ලුවට ලක් කරන අපහාසාත්මක භාෂා භාවිතයෙන් වැළකී සිටිමු

ශ්‍රී ලංකාව තුළ කාන්තාවන් බොහෝ විට රාමුගත කරනු ලබන්නේ, ඔවුන්ට කළ හැකි හෝ ඔවුන් කළ යුතු දේ පිළිබඳව පවතින යල්පැනගිය උපකල්පන පදනම් කරගනිමිනි.[19] මෙය විවිධ තේමා ඔස්සේ දක්නට ලැබේ. උදාහරණයක් ලෙස, දේශපාලන පුවත් වාර්තාකරණය තුළ කාන්තාවන් පිළිබඳව විස්තර කිරීමේදී "මෘදු කතා විලාසය" හේතුවෙන් ඔවුන් දේශපාලනයට උචිත නොවන්නේ යැයි සඳහන් විය හැක. ක්‍රීඩා පුවත් වාර්තා කිරිමේදී කාන්තා ක්‍රීඩිකාවන් අසාමාන්‍ය පිරිසක් ලෙස හෝ ඔවුන් එම ක්‍රීඩාවල නියැලීමම සුවිශේෂී සිද්ධියක් ලෙස හුවා දැක්වීම සිදු විය හැක.[20] එවැනි නිරූපණයන් මගින් කාන්තාවන්ගේ වෘත්තීමය අනන්‍යතාව යටපත් වී ඒ වෙනුවට ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂභාවය කෙරෙහි අනවශ්‍ය අවධානයක් යොමු කෙරේ. මෙම කරුණ ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය සඳහා වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රඥප්තිය (Media Gender Charter) මගින් ද ඉස්මතු කර ඇති අතර, කාන්තාවන් බොහෝ විට ඔවුන්ගේ වෘත්තීය අනන්‍යතාවට වඩා ගෙදරදොර වැඩකටයුතුවලට අදාළ භූමිකාවන් හරහා විස්තර කෙරෙන බව එය පෙන්වා දේ.[21]

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- දේශපාලනය, විද්‍යාව, ව්‍යාපාර, ක්‍රීඩා සහ තාක්ෂණික ක්ෂේත්‍රවල කාන්තාවන්ගේ සහභාගිත්වය අසාමාන්‍ය හෝ මවිතයට කරුණක් ලෙස නොව, සාමාන්‍ය සහ සුදුසු දෙයක් ලෙස සලකමු.
- වෘත්තීමය සන්දර්භයන් තුළ පුවතට අදාළ නොවන ඒකාකෘතික කාන්තා ගුණාංගවලට ව්‍යවහාර කිරීමෙන් වළකිමු. නිදසුනක් ලෙස, "සුමුදු" හෝ "සියුමැලි දෑත්" වැනි යෙදුම් භාවිතා කිරීම දැක්විය හැක. මෙවැනි භාෂා භාවිතයක් මගින් කාන්තාවන් අදාළ වෘත්තීය ක්ෂේත්‍රයට සහජයෙන්ම උචිත නොවන බව හැඟවිය හැක. එමෙන්ම, ඇතැම් ක්ෂේත්‍රවල වෘත්තීය ප්‍රවීණත්වය පුරුෂ පක්ෂයට පමණක් උරුම වූවක් බවත්, එහි නියැලෙන කාන්තාවන් සාමාන්‍ය තත්ත්වයෙන් බැහැර වූ සුවිශේෂී පිරිසක් බවත් ය යන මතය එමගින් තහවුරු වීමට ඉඩ ඇත.

**වාර්තාකරණය සඳහා නිදසුන්**

| භාවිතයෙන් වළකිමු | භාවිතා කරමු |
|---|---|
| ***"කතාවට කියන්නේ පිරිමින්ගේ හොර වැඩ අල්ලන්නට කාන්තාවන් තරම් දක්ෂයන් මිහිපිට නැති බවය. අපේ කල්පනාවේ හැටියට ඒ සහජ හැකියාවට දැන් ලොකුම වටිනාකම දී ඇත්තේ වැඩ බලන පොලිස්පති...... ඒ දැන් රටේම හොර වැඩ අල්ලන්න කාන්තාවකට භාර දී තිබීම නිසාය."[22]*** | ***"ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරී <නම> අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධුරයට පත් කර ඇත. එම පත් කිරීම සිදු කර ඇත්තේ ඇයගේ සේවා වාර්තාව, විමර්ශන පළපුරුද්ද සහ ආයතනික රෙගුලාසි පදනම් කරගෙනය."*** |

19 'කාන්තාවන් පිළිබඳ ඒකාකෘති (stereotypes) තහවුරු කරන ආකාරයේ භාෂාව භාවිත නොකරන්න. එවැනි භාෂාව අප්‍රසන්න වන අතර, එය යල් පැන ගිය සහ බොහෝ විට සරලවම, සාවද්‍ය වේ.' රොයිටර්ස් (Reuters), රොයිටර්ස්හි පුවත්පත් කලාව පිළිබඳ අත්පොත (Reuters Handbook of Journalism) (2015), 417 < https://www.mediareform.org.uk/wp-content/uploads/2015/12/Reuters_Handbook_of_Journalism.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19; 'ලෝකය සහ එහි ඇති විභවතාවන් නිසි ලෙස නිරූපණය නොකරන සහ සමාජය පිළිබඳ ද්විමාන චිත්‍රයක් තහවුරු කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ඒකාකෘති භාවිතා කිරීමෙන් වැළකී සිටින්න.' එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධානය (UN Women), ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ගැටුම්කාරී තත්ත්වයන් පිළිබඳ සංවේදී වාර්තාකරණය සඳහා වන මාර්ගෝපදේශ (Guidelines for Gender and Conflict-sensitive Reporting) (2019) 'ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වාර්තාකරණයේ ප්‍රධාන මූලධර්ම පහ (Five Key Principles of Gender-Sensitive Reporting)', 5 < https://eca.unwomen.org/sites/default/files/Field%20Office%20ECA/Attachments/Publications/2019/07/Guidelines%20for%20Media%20and%20Gender%20Ukraine/Guidelines_ENG_prew_40719_compressed.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

20 එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධානය (UN Women) තුර්කිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ක්‍රීඩා වාර්තාකරණය සඳහා වන අත්පොත (Gender-Responsive Sports Reporting Handbook) (2025) < gender_responsive_sports_reporting_handbook.pdf > ප්‍රවේශය 2026 අප්‍රේල් 6.

21 ශ්‍රී ලංකා සංවර්ධන මාධ්‍යවේදීන්ගේ සංසදය, ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය සඳහා වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රඥප්තිය (Media Gender Charter) (2020) < https://ldjf.org/assets/downloads/publications/mgc-sri-lanka.pdf> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

22 එතික්ස් අයි (Ethics Eye), 'පිරිමින්ගේ හොර වැඩ ඇල්ලීම කාන්තාවන්ගේ සජහ හැකියාවක් ද?' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2024 දෙසැම්බර් 17) < https://www.facebook.com/share/p/19jmBRw7Xi/ > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

| භාවිතයෙන් වළකිමු | භාවිතා කරමු |
|---|---|
| *"සුමුදු අතින් යකඩ නවන සුන්දරියෝ"*[23] | *"ඇය ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිසැල/ හාඩ්වෙයාර් වෙළඳසැල විශ්වාසයෙන් සහ කාර්යක්ෂමව මෙහෙයවන්නීය."* |
| *"ගිනි තියන හමුදාවේ හිටියට ගිනි නිවන හමුදාව කතුන්ට අකැප ද?"*[24] | *"හැම තැනකම කරට කර සිටියත්, ගිනි නිවන හමුදාව තවමත් කාන්තාවන්ට අකැප ද?"* |
| *"වළලු දැමූ සිනිඳු අත්වල වළලු වෙනුවට ටිකට් පොතක් අතට දුන්නේ ගිය සතියේය."* | *"ශ්‍රී ලාංකේය කාන්තාවන් මෙතෙක් කාලයක් නියැලී නොසිටි බස් කොන්දොස්තර වෘත්තියට නව පණක් එක් කරමින්, පසුගිය සතියේ සිට කාන්තාවන් බස් කොන්දොස්තරවරියන් ලෙස සේවය කිරීම ආරම්භ කළහ."* |

**මෙය වැදගත් වන්නේ ඇයි?** කාන්තාවන්ගේ වෘත්තීමය හැකියාවන් වෙනුවට ඔවුන් කෙරෙහි වන නිෂේධනාත්මක ඒකාකෘති ඔස්සේ ඔවුන් නිරූපණය කිරීම මගින්, ඔවුන් සතු කුසලතා, සුදුසුකම් සහ ජයග්‍රහණ කෙරෙහි යොමුවන අවධානය වෙනතකට යොමු කෙරේ. එමෙන්ම, කාන්තාවන් ඇතැම් වෘත්තීන් හෝ තාක්ෂණික ක්ෂේත්‍රයන්ට සහජයෙන්ම උචිත නොවන බවත්, සැමවිටම ඔවුන් එහි නියැලීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළ යුතු හෝ, සුදුසුකම් පෙන්විය යුතු හෝ හෝ එසේ නියැලීම සුවිශේෂී තත්ත්වයක් ලෙස සැලකිය යුතු බවත් යන මතය තහවුරු කිරීමටද එය හේතු වේ.[25]

23 එතික්ස් අයි (Ethics Eye), 'ස්ත්‍රී පුරුෂ භේදය ඔස්සේ ඒකාකෘතික වී ඇති වෘත්තීන්?' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2023 මාර්තු 16) < www.facebook.com/share/p/1G7fjYCdBU/> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

24 එතික්ස් අයි (Ethics Eye), 'මෙම වාර්තාකරණය සුදුසු ද?' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2026 පෙබරවාරි 23) < https://web.facebook.com/ethicseye/posts/pfbid0adzsdE6Mwz1h8tWMtR26c7BxxbU4GfMikzHYyd3W1U257sAjjDfDfUuRQNJ54twTl > ප්‍රවේශය 2026 පෙබරවාරි 27.

25 එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධානය (UN Women) තුර්කිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ක්‍රීඩා වාර්තාකරණය සඳහා වන අත්පොත (Gender-Responsive Sports Reporting Handbook) (2025) < gender_responsive_sports_reporting_handbook.pdf > ප්‍රවේශය 2026 අප්‍රේල් 6.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## 1.2 සමාන අවස්ථාවලදී පිරිමින්ගෙන් සහ කාන්තාවන්ගෙන් වෙනස් ප්‍රශ්න ඇසීමෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘති (GENDER STEREOTYPES) තහවුරු කිරීමෙන් වැළකෙමු

සම්මුඛ සාකච්ඡාවලදී පුරුෂ පක්ෂයෙන් බොහෝ විට විමසනු ලබන්නේ ඔවුන්ගේ වෘත්තීය සැලසුම්, විශේෂඥභාවය සහ අදාළ විෂය කරුණු සම්බන්ධයෙන් ඔවුන් ලබා දී ඇති දායකත්වය පිළිබඳවයි. එහෙත්, කාන්තාවන්ගෙන් විමසන ප්‍රශ්න බොහෝ විට විවාහය, දරුවන් රැකබලා ගැනීම, රැකියාවක නිරත වීමට ඇති “අවසරය” හෝ විවිධ භූමිකාවන් “සමබරව” පවත්වා ගැනීම වැනි කරුණු වෙත යොමු වේ. එම කරුණු පුවතට අදාළ නොමැති අවස්ථාවලදී පවා මෙය සිදු වීම දක්නට ලැබේ. එමගින් වෘත්තීමය විශ්වසනීයත්වය වෙත යොමු විය යුතු අවධානය පුද්ගලයාගේ පෞද්ගලික ජීවිතය දෙසට යොමු කෙරේ.

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- ප්‍රතිවර්ත්‍යතා (Reversibility) පරීක්ෂණයක් භාවිතා කරමු: එනම්, එවැනිම පුවතක් තුළ, එම සංස්කරණ අරමුණ සඳහාම, එම භූමිකාවම දරන පිරිමියෙකු වෙත වුව ද එම ප්‍රශ්නයම යොමු කරන්නේදැයි කල්පනා කර බලමු.[26] එය එසේ නොවේ නම්, එම ප්‍රශ්නය සැබවින්ම එම අවස්ථාවට අදාළ නොවීමට ඉඩ ඇත. ඒ වෙනුවට, කාන්තාවන්ට වෙනස් කොට සලකන බවක් ඉන් පිළිබිඹු විය හැක.
- එම පුවත මගින් මහජන අභිලාෂය වෙනුවෙන් පවුල් පසුබිම සැබවින්ම අදාළ වන්නේ නම් මිස, අදාළ පුද්ගලයාගේ කාර්යය, තීරණ සහ විශේෂඥභාවය කෙරෙහි පමණක් අවධානය යොමු කරමු.

**වාර්තාකරණය සඳහා නිදසුන්**

| භාවිතයෙන් වළකිමු | භාවිතා කරමු |
|---|---|
| ***“ඔබ කාර්යබහුල වෙනකොට සැමියා කියන්නේ නැද්ද රඟපාන්න එපා කියලා?”[27]*** | ***“මේ වගේ කාර්යබහුල වෘත්තියක නියැලෙන්න ඔබේ පවුලෙන් ලැබෙන සහයෝගය ඔබට කොයිතරම් වැදගත්ද?”*** |
| ***“කාන්තාවෝ පිරිසකට එකට එකතු වෙලා වැඩක් කරන්න බෑයි කියනවනේ, මේ... රංඩු කරගන් නැතුව?”[28]*** | ***“වෘත්තීයවේදීන් පිරිසක් ලෙස, ඔබ හැමෝම එකම අරමුණක් වෙනුවෙන් මේ තරම් කැපවීමෙන් වැඩ කරන්නේ කොහොමද?”*** |

**මෙය වැදගත් වන්නේ ඇයි?** සම්මුඛ සාකච්ඡා රාමුගත කරනු ලබන ආකාරය මගින් පුද්ගල විශ්වසනීයත්වය පිළිබඳව ඉඟි ලබා දෙයි. එහිදී කාන්තා පිරිමි දෙපාර්ශ්වයටම එක හා සමාන ප්‍රවේශයන් යොදා ගැනීම මගින් අදාළ කාන්තාවන් අසාමාන්‍ය චරිත වශයෙන් නොව වෘත්තිකයින් වශයෙන් සැලකීමට ප්‍රේක්ෂකයින් යොමු කෙරේ. ඔවුන් වෙත ලැබෙන පිළිගැනීම පෞද්ගලික ජීවිතයේ කරුණු කාරණා මත රඳා පවතින්නක් ලෙස සැලකීම ද එමගින් වැළකේ.

26 එම.

27 එතික්ස් අයි (Ethics Eye), ‘පුවත්පත් අතිරේකවල සම්මුඛ සාකච්ඡා තුළින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විෂමතාවන් තහවුරු කිරීම සහ ඒ හා බැඳුණු ගැටලු’ (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2017 පෙබරවාරි 8) < www.facebook.com/share/1Dz62Zzh65/ >ප්‍රවේශය 2026 පෙබරවාරි 19; එතික්ස් අයි (Ethics Eye), ‘කාන්තාවන්ට පමණක් වැටෙන තහංචි?’ (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2024 මැයි 8) < www.facebook.com/share/p/16x3naVis5/> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

28 එතික්ස් අයි (Ethics Eye), 2025 මාර්තු මාසයේදී බැංකොක් බලා පියාසර කළ, කාර්ය මණ්ඩලය කාන්තාවන්ගෙන් පමණක් සමන්විත වූ ශ්‍රී ලංකන් ගුවන් සේවයට අයත් ගුවන් යානයක කළමණාකාරිනිය සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකින් උපුටා ගැනීමක්; (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2025 මාර්තු) < www.facebook.com/share/r/17KB9YjVYw/> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## 1.3 කාන්තාවන් අතාර්කික, පහත් හෝ අදක්ෂ පුද්ගලයින් වශයෙන් පිළිබිඹු කරන නිෂේධනාත්මක යෙදුම් භාවිතා කිරීමෙන් වැළකෙමු

වාර්තාකරණයේදී "කාන්තාව" යන්න හෝ ස්ත්‍රී ලක්ෂණ, දුර්වලකම, මෝඩකම, දුර්වල විනිශ්චය හෝ පහත් බව හැඟවීම සඳහා කෙටි යෙදුම් ලෙස භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. ශ්‍රී ලාංකේය මාධ්‍ය සහ එදිනෙදා කථනයේදී, ඇතැම් ප්‍රකාශ මගින් කාන්තාවන් ස්වභාවයෙන්ම බුද්ධියෙන් අඩු, හැකියාවෙන් අඩු හෝ ගෘහස්ථ වැඩ සඳහා පමණක් සුදුසු අය ලෙස නිරූපණය කෙරේ.

නිදසුනක් වශයෙන්, කාන්තාවන් බුද්ධියෙන් පහත් බව අඟවන "ගෑණු වැඩක් කරලා" හෝ "ගෑණුන්ගේ මොළේ හැඳි මිටේ" වැනි යෙදුම් භාවිතා කිරීම මගින් කාන්තාවන්ගේ නිපුණතාව සහ සමාජීය භූමිකාව පිළිබඳ හානිකර ඒකාකෘති (Stereotypes) තහවුරු කරයි. ඒ හා සමානව, "චීත්ත වැඩ කරන්න එපා" වැනි ප්‍රස්තාව පිරුළු මගින් ස්ත්‍රීත්වය යනු පහත් ලක්ෂණ සමූහයක් දක්වා ඌනනය කරයි. මෙවැනි ප්‍රකාශ තුළින් කාන්තාවන් කෙරෙහි පවතින අවඥාව සාමාන්‍යකරණය කරන අතර, ඔවුන්ගේ විශ්වසනීයත්වය සහ හැකියාව පිළිබඳව ප්‍රේක්ෂකයින් දකින ආකාරය ද හැඩගස්වනු ලබයි.

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය අත්වැරදීම්, දුර්වල විචාර බුද්ධිය හෝ නොහැකියාවට හේතුවක් වශයෙන් නොදක්වා සිදු වූ දේ පමණක් විස්තර කරමු.
- කාන්තාවන් "උපතින්ම" අතාර්කික, අනුවණ, පහත් හෝ ගෙදරදොර වැඩකටයුතුවලට පමණක් සුදුසු අය බව හඟවන ප්‍රස්තාව පිරුළු හෝ කියමන් නැවත නැවත භාවිතා කිරීමෙන් වළකිමු.

**වාර්තාකරණය සඳහා නිදසුන්**

| භාවිතයෙන් වළකිමු | භාවිතා කරමු |
|---|---|
| ***සන්දර්භය: එක්තරා පුද්ගලයෙකු පන්දහසේ නෝට්ටු කිහිපයක් නිවසේ භාවිතයෙන් ඉවත් කරන ලද පොතක සඟවා තිබූ පුවතක් වාර්තා වී තිබූ අතර එම පොත නිවසේ තිබූ තැන නැති බව දුටු විට තම බිරිඳ එය පුළුස්සා දමන්නට ඇතැයි ඔහු සැක කළ ආකාරය පහත පරිදි විස්තර කර තිබිණි.***<br><br>***"ඔහු එකත් එකටම සිතුවේ භාර්යාව මේ පොත් තොගය ගිනි රකුසාට භාර දෙන්නට ඇති කියාය. ඒ ඇයගේ නුවණ හැඳිමිටේ ඇති බව දන්නා නිසාය".[29]*** | ***"ඉවත දැමූ පොතක් තුළ රුපියල් 5,000 නෝට්ටු සැඟවූ පුද්ගලයෙකු, එම පොත නිවසේ දක්නට නොලැබුණු තැන සිය බිරිඳ එම පොත් ගොන්නම පුළුස්සා දමන්නට ඇතැයි සැක කිරීමේ සිදුවීමක් වාර්තා වේ."*** |

**මෙය වැදගත් වන්නේ ඇයි?** ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් උපහාසය මගින් පුවතට අදාළ කිසිදු තොරතුරක් ඊට ඇතුළත් නොකෙරේ. ඒ වෙනුවට, කාන්තාවන් කොන් කිරීමට එය හේතු වන අතර, කාන්තාවන් සහජයෙන්ම පුරුෂයින්ට වඩා හැකියාවෙන් අඩු, තාර්කිකත්වයෙන් අඩු හෝ විශ්වසනීයත්වයෙන් අඩු පිරිසක්ය යන මතය තහවුරු කරයි.

29 එතික්ස් අයි (Ethics Eye), '"කාන්තාවන්ගේ නුවණ හැඳි මිටේ" — මෙවැනි මත මාධ්‍ය ප්‍රචලිත කිරීම අනුමත කරනවා ද?' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2024 නොවැම්බර් 1) < www.facebook.com/share/p/1EEyusBz4B/> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## 1.4 කාන්තාවන් ලිංගිකකරණයට ලක් කිරීමෙන් හෝ ඔවුන්ගේ බාහිර පෙනුම අනවශ්‍ය ලෙස ඉස්මතු කිරීමෙන් හෝ වැළකෙමු

පුවතට අදාළ නොවන අවස්ථාවල පවා කාන්තාවන් බොහෝ විට ඔවුන්ගේ බාහිර පෙනුම, ඇඳුම් පැළඳුම් හෝ ලිංගිකත්වය ඉඟි කරන ලක්ෂණ ඔස්සේ විස්තර කිරීම දක්නට ලැබේ.[30] එමගින් පාඨකයාගේ අවධානය අදාළ සිද්ධිය වෙනුවට එම කාන්තාව ගේ බාහිර පෙනුම වෙතට හැරවේ.

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- පුවතට අත්‍යවශ්‍ය වන්නේ නම් මිස, කාන්තාවකගේ බාහිර පෙනුම, ඇඳුම් පැළඳුම් හෝ කොණ්ඩ විලාසිතාව ගැන සඳහන් නොකර සිටිමු — එසේ කරන්නේ නම් පිරිමින් සම්බන්ධයෙන් ද එවැනිම විස්තර ඇතුළත් කරන්නේ දැයි කල්පනා කර බලමු.[31]
- විශේෂයෙන්ම බාහිර පෙනුම පුවතට කිසිසේත්ම අදාළ නොවන අපරාධ, මරණ හෝ අනතුරු පිළිබඳ පුවත් වාර්තාකරණයේදී "රූමත්", "සුරූපී", "සුන්දර" හෝ "ලස්සන" වැනි විශේෂණ පද භාවිතා කිරීමෙන් වළකිමු.
- දෘශ්‍ය රූප (Visuals) තෝරා ගැනීමේදී කාන්තාවන්ගේ ශරීර අවයව හෝ ඇඳුම් පැළඳුම් ලිංගිකත්වය ඉස්මතු වන අයුරින් අතිශයෝක්තියට නංවන කාටූන්, නිදර්ශන (Illustrations) හෝ රූප භාවිතා කිරීමෙන් වැළකී සිටිමු.

**වාර්තාකරණය සඳහා නිදසුන්**

| භාවිතයෙන් වළකිමු | භාවිතා කරමු |
|---|---|
| *ලොවම පුදුම කළ ලක් මව සුරකින රූමතිය. දකුණු ආසියාවේ පළමු ලෝඩ් මාස්ටර් නිලධාරිනිය ඇයයි.[32]* | *ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් කාන්තාවක් "ලෝඩ් මාස්ටර්" නිල ලාංඡනයෙන් පිදුම් ලබා ඇති අතර, ඒ අනුව දකුණු ආසියාවේ ප්‍රථම ලෝඩ් මාස්ටර්වරිය ලෙස ඇය වාර්තාගත වේ.* |
| *සන්දර්භය: තම සහකරු අතින් ඝාතනය වූ පුද්ගලයෙකු පිළිබඳව මෙම පුවතින් කියැවෙන අතර එහි පහත සඳහන් ආකාරයට මිය ගිය පුද්ගලයා විස්තර කර තිබිණි.*<br><br>*උසට සරිලන මනා රූසපුවකට හිමිකම් කී [නම], 25 වියේ පසු වූ සුන්දර යුවතියකි.[33]* | *25 හැවිරිදි කාන්තාවක් ඇයගේ පෙම්වතා විසින් ඝාතනය කර ඇති බවට වාර්තා වේ.* |

30 මහාචාර්ය අනුරුද්ධි එදිරිසිංහ සහ කණ්ඩායම, ශ්‍රී ලාංකීය පුවත්පත්වල කාන්තාවන්ගේ සහ ගැහැණු දරුවන්ගේ අස්වාභාවික මරණ පිළිබඳ වාර්තාකරණය (Reportage of Unnatural Deaths of Women and Girls in Sri Lankan Newspapers) (UNFPA ශ්‍රී ලංකා, 'ජනගහනය වැදගත් වේ' (Population Matters) Policy Issue 07, 2018 පෙබරවාරි) < https://srilanka.unfpa.org/sites/default/files/pub-pdf/6.%20PolicyBrief07_English_0.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

31 රොයිටර්ස් (Reuters), පුවත්පත් කලාව පිළිබඳ අත්පොත (Handbook of Journalism) (2015) < www.mediareform.org.uk/wp-content/uploads/2015/12/Reuters_Handbook_of_Journalism.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

32 වෙරිටේ මීඩියා (Verité Media), 'ලෝඩ්මාස්ටර්වරියක වූ "රූමතිය"?' (ඉන්ස්ටාග්‍රෑම්, 2025 අප්‍රේල් 9), < https://www.instagram.com/p/DIOrsoqTQ_K/?igsh=MmRpN2M3a3MyMmEy > ප්‍රවේශය 2026 අප්‍රේල් 02.

33 වෙරිටේ මීඩියා (Verité Media), 'පුද්ගලයෙකුගේ බාහිර පෙනුම පුවතට අදාළ ද?' (ඉන්ස්ටාග්‍රෑම්, 2026 මාර්තු 20), < www.instagram.com/p/DWG24bLDBRc/?utm_source=ig_web_button_share_sheet> ප්‍රවේශය 2026 අප්‍රේල් 02.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

**මෙය වැදගත් වන්නේ ඇයි?** බාහිර පෙනුම මුල් කරගත් රාමුගත කිරීම් මගින්, කාන්තාවන් ඇගයීමේදී විශ්වසනීයත්වය හෝ හැකියාව නොව "ආකර්ෂණීය බව" මිනුම් දණ්ඩක් ලෙස යොදා ගැනීමට පාඨකයින් හුරු කරවනු ලැබේ. ඒ හේතුවෙන්, කාලයත් සමඟ මෙය ජන ජීවිතය තුළ කාන්තාවන්ට සලකන ආකාරය කෙරෙහි බලපෑමක් ඇති කරයි. එමෙන්ම, තමන් සම්බන්ධයෙන් වැදගත් වන්නේ කුමක් ද යන්න පිළිබඳව ගැහැණු දරුවන් ඇති කර ගන්නා වැටහීම කෙරෙහි ද එය බලපෑමක් එල්ල කරයි.[34] මනෝවිද්‍යාත්මක හා වෛද්‍ය පර්යේෂණවලට අනුව, කාන්තාවන් ලිංගිකකරණයට ලක්වූ සහ ඒකාකෘතිකරණයන්ට සීමාවූ නිරූපණයන්ට නිරන්තරයෙන් නිරාවරණය වීම නිසා ශරීරය පිළිබඳ අහිතකර ආකල්ප ඇති වීමට ඉඩ ඇති අතර ආහාර ගැනීමේ අක්‍රමිකතා (Eating disorders) ඇති වීමේ වැඩි අවදානමකටත් ඔවුන් මුහුණ පෑ හැක. එමෙන්ම, ඔවුනට අනෙකුත් මානසික සෞඛ්‍ය ගැටලු ඇති වීමටත් එය හේතු වේ.[35]

## 1.5 කාන්තාවන් හෝ කාන්තාවන් බහුලව නියැලෙන වෘත්තීන් හැඳින්වීමට යල් පැන ගිය හෝ අවමන්සහගත වෘත්තීමය යෙදුම් භාවිතා කිරීමෙන් වැළකෙමු

කාන්තාවන් නිෂේධනාත්මක අයුරින් නිරූපණය කරන පැරණි සංස්කෘතික ආකල්ප පිළිබිඹු කරන ඇතැම් සිංහල යෙදුම් පුවත් වාර්තාකරණයේදී භාවිතා වීම මාධ්‍ය තුළ දක්නට ලැබේ. එවැනි යෙදුම් මගින් ඇතැම් වෘත්තීන් ලැජ්ජා සහගත, පහත් තත්ත්වයේ හෝ සදාචාරාත්මකව ගැටලුකාරී වශයෙන් නිරූපණය කරනු ලැබේ.[36] මාධ්‍යවේදීන් එවැනි භාෂා භාවිතයන් පිළිබඳව නැවත සලකා බැලීම වැදගත් වන අතර, හැකි සෑම විටම වඩාත් මධ්‍යස්ථ සහ වෘත්තීමය යෙදුම් භාවිතා කිරීම යෝග්‍ය වේ. මෙය දැනටමත් ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි මාධ්‍ය වාර්තාකරණය තුළ දක්නට ලැබෙන වෙනස්කම්වලට සමාන වේ; එහිදී වඩාත් අවමන්සහගත යෙදුම් වෙනුවට "Domestic worker" (ගෘහ සේවක/සේවිකා) සහ "Sex worker" (ලිංගික ශ්‍රමික) වැනි පද වැඩි වශයෙන් භාවිතා වීම දක්නට ලැබේ. සිංහල වාර්තාකරණයේදී ද සදාචාරය හා සම්බන්ධ කිසිදු විනිශ්චයකින් තොරව අදාළ වෘත්තිය නිවැරදිව විස්තර කරන වචන තෝරා ගැනීම මගින් මෙවැනිම වෙනස්කම් සිදු කළ හැක.

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- අපවාදයට ලක් කිරීමකින් හෝ සදාචාරය පිළිබඳ නිගමනයන්ට එළැඹීමකින් තොරව අදාළ කාර්යය විස්තර කරන වෘත්තීමය යෙදුම් භාවිතා කරමු.
- කාන්තාවන්ට අදාළව අසමාන හෝ යල් පැන ගිය සමාජ ආකල්පයන් පිළිබිඹු කරන පැරණි සිංහල යෙදුම් භාවිතය පිළිබඳව නැවත සලකා බලමු.

මෙරට පවතින සන්දර්භය තුළ මෙම මාර්ගෝපදේශය විශේෂයෙන්ම අදාළ වන ක්ෂේත්‍ර දෙකක් පහත දැක්වේ:

**a. ගෘහ සේවය**

සිංහල වාර්තාකරණයේදී "මෙහෙකාරිය" හෝ "වැඩකාරිය" (Servant) යන යෙදුම් භාවිතා කිරීම නිතර දක්නට ලැබෙන්නකි. මෙම යෙදුම් මගින් පැරණි ස්වාමි-සේවක සම්බන්ධතාව ඉස්මතු කෙරෙන අතර, වර්තමානයේ පවතින වඩාත් වෘත්තීමය සේව්‍ය-සේවක යථාර්ථයට එය නොගැලපේ. ගෘහ සේවය යනු ගරුත්වයක් සහිත ශ්‍රමයක් ලෙස පිළිගැනීම වෙනුවට, සේවකයා යටහත් පහත් පුද්ගලයෙකු ලෙස එමගින් රාමුගත කෙරේ.

34 ඇමරිකානු මනෝවිද්‍යා සංගමය (American Psychological Association), ගැහැණු ළමුන් ලිංගිකකරණයට ලක් කිරීම පිළිබඳ APA කාර්ය සාධක බලකායේ වාර්තාව (Report of the APA Task Force on the Sexualization of Girls) (2007) < www.apa.org/pi/women/programs/girls/report-full.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

35 ෆැබ්‍රිසියෝ සැන්ටොනික්කෝලෝ සහ කණ්ඩායම, 'ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ මාධ්‍ය නිරූපණය: ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ඒකාකෘති, වස්තුකරණය සහ ලිංගිකකරණය පිළිබඳ සාහිත්‍ය සමාලෝචනයක්' (Gender and Media Representations: A Review of the Literature on Gender Stereotypes, Objectification and Sexualization) (2023) 20 පරිසර පර්යේෂණ සහ මහජන සෞඛ්‍ය පිළිබඳ ජාත්‍යන්තර සඟරාව (International Journal of Environmental Research and Public Health) 5770 < https://doi.org/10.3390/ijerph20105770 > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

36 'සමාජය, මානුෂීය අත්දැකීම්, ක්‍රියාවන්, මතවාද සහ සැලකිල්ලට භාජනය විය යුතු කරුණු නිසි ලෙස නිරූපණය වන පරිදි, මාධ්‍ය වාර්තාකරණයේදී කාන්තාවන් සහ පිරිමින්ගේ නියෝජනය සමබර කරන්න' එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධානය (UN Women), ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ගැටුම්කාරී තත්ත්වයන් පිළිබඳ සංවේදී වාර්තාකරණය සඳහා වන මාර්ගෝපදේශ (Guidelines for Gender and Conflict-sensitive Reporting) (2019)

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

**වාර්තාකරණය සඳහා නිදසුන්**

| භාවිතයෙන් වළකිමු | භාවිතා කරමු |
| --- | --- |
| *"දරුවා බලාගත් මෙහෙකාරිය නිරුවත් කර සමාජ මාධ්‍යවල දමලා"[37]* | *"දරුවා බලාගැනීමට සිටි ගෘහ සේවිකාව නිරුවත් කොට, වීඩියෝ කිරීමෙන් අනතුරුව සමාජ මාධ්‍ය වෙත මුදා හැරි බවට වාර්තා වේ."* |

### b. ලිංගික ශ්‍රමිකයින්

සිංහල වාර්තාකරණයේදී නිතරම "ගණිකා" (Prostitute) යන යෙදුම භාවිතා කෙරේ. එම යෙදුම බොහෝ විට සදාචාරය පිළිබඳ විනිශ්චයකින් යුක්ත වන අතර, විශේෂයෙන්ම අපරාධ පිළිබඳ පුවත්වලදී අදාළ සිදුවීම හැඟීම් කළඹවන අයුරින් වාර්තා කිරීම සඳහා එය යොදා ගැනේ. එහිදී අපකීර්තිමත් සිද්ධියක් හෝ චරිතයේ ස්වභාවය හඟවන කෙටි යෙදුමක් ලෙස එයා යොදා ගනු ලැබේ. මෙවැනි රාමුගත කිරීම් මගින් කරුණුවලින් ඉවතට අවධානය යොමු කෙරෙන අතර, අදාළ පුද්ගලයා සමාජ අපවාදයට ලක් කිරීමට ඉඩ තබයි.

ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂා වාර්තාකරණයේදී මධ්‍යස්ථ යෙදුමක් ලෙස "Sex worker" (ලිංගික ශ්‍රමිකයා) යන්න බහුලව භාවිතා වීම දක්නට ලැබේ. වෘත්තිය පිළිබඳ තොරතුරු පුවතට සැබවින්ම අදාළ වන අවස්ථාවලදී "ලිංගික ශ්‍රමිකයා" (Sex worker) යන යෙදුම භාවිතා කිරීම මගින් සිංහල වාර්තාකරණයට ද එම ප්‍රවේශය අනුගමනය කළ හැක.

| භාවිතයෙන් වළකිමු | භාවිතා කරමු |
| --- | --- |
| *ගණිකා සේවයේ යෙදුණු සුරූපී කතුන් දැලේ[38]* | *ලිංගික ශ්‍රමිකයින් ලෙස සේවය කළ කාන්තාවන් අත්අඩංගුවට* |

**මෙය වැදගත් වන්නේ ඇයි?** විශේෂයෙන්ම හැඟීම් කළඹවන ආකාරයේ පුවත් වාර්තා කිරීමේදී භාවිතා වන යල් පැන ගිය සහ අවමන්සහගත භාෂාව මගින් සිදු වන්නේ හුදෙක් වෘත්තියක් විස්තර කිරීම පමණක්ම නොවේ; ඒ හරහා කාන්තාවන් පිළිබඳව සහ ඔවුන් හා බැඳුණු විවිධ වෘත්තීන් පිළිබඳව වන සමාජීය විනිශ්චයන් ද පිළිබිඹු කෙරේ. පැහැදිලි සහ ගෞරවය හඟවන භාෂා භාවිතය නිවැරදි වාර්තාකරණයකට අනුබල දේ. එමෙන්ම, වාර්තාකරණයට ලක්වන පුද්ගලයින් හුදෙක් ලේබල් ලෙස නොව පුද්ගලයින් ලෙස සැලකීමටත්, නොදැනීම ඔවුන්ට සිදුවිය හැකි හානිය වළක්වා ගැනීමටත් එය මාධ්‍යවේදීන්ට උපකාර කරයි.

37 එතික්ස් අයි (Ethics Eye), 'මෙහෙකාරිය? ' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2026 ජනවාරි 21) < www.facebook.com/share/p/1Adp3vDDGm/ > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

38 එතික්ස් අයි (Ethics Eye), 'ගණිකා වෘත්තිය ද ලිංගික සේවා සැපයීම ද?' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2021 මාර්තු 15) < www.facebook.com/share/p/18FHJmQkM9/ > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## සාරාංශය - ස්ත්‍රී පුරුෂ නියෝජනය පිළිබඳ වාර්තා කිරීමේ පිරික්සුම් ලැයිස්තුව

| | භාවිතයෙන් වළකිමු | භාවිතයට ගනිමු |
|---|---|---|
| 1.1 | කාන්තාවන්ගේ ප්‍රවීණත්වය "මවිතයට කරුණක්", "අසාමාන්‍ය" හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට වඩා අඩු වැදගත්කමක් උදුලන්නක්ය යනුවෙන් හඟවන ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ නිෂේධනාත්මක ඒකාකෘති. | නිපුණත්වය සහ කාර්යභාරයට මුල්තැන දෙමු. පොදු සහ වෘත්තීය ජීවිතය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය සාමාන්‍ය මෙන්ම පිළිගැනීමක් ඇති දෙයක් ලෙස ද සලකමු; විශ්වසනීයත්වයට හේතු දැක්වීමේදී ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය නොව පළපුරුද්ද, සුදුසුකම් සහ හැකියාව යොදා ගනිමු. |
| 1.2 | සමාන අවස්ථාවලදී කාන්තා පිරිමි දෙපාර්ශ්වයෙන් එකිනෙකට වෙනස් ප්‍රශ්න ඇසීම. විශේෂයෙන්ම වෘත්තියට අදාළ පුවතකදී විවාහය, දරුවන් රැකබලා ගැනීම, "රැකියාවක නියුතු වීමට ඇති අවසරය" හෝ භූමිකාවන් සමබරව පවත්වා ගැනීම පිළිබඳ ප්‍රශ්න මීට ඇතුළත් වේ. | ප්‍රතිවර්ත්‍යතා පරීක්ෂණයක් (Reversibility test) භාවිතා කරමු: එනම්, එම සංස්කරණ සන්දර්භය තුළම, එම පුවතටම අදාළව එම භූමිකාවම දරන පුරුෂයෙකුගෙන් වුව ද එම ප්‍රශ්නයම විමසන්නේදැයි අපගෙන්ම විමසා බලමු. පවුල් පසුබිම පිළිබඳ කරුණු සැබවින්ම අදාළ වන්නේ නම් මිස, සැමවිටම වෘත්තිය, තීරණ සහ ප්‍රවීණත්වය කෙරෙහි පමණක් අවධානය යොමු කරමු. |
| 1.3 | අතාර්කික බව, පහත් බව, අනුවණකම හෝ නොහැකියාව හැඳින්වීමට කෙටි යෙදුම් ලෙස "කාන්තාව" යන වචනය හෝ කාන්තා ගති ලක්ෂණ යොදා ගන්නා නිෂේධනාත්මක යෙදුම්. | අත්වැරදීම්, දුර්වල විචාර බුද්ධිය හෝ නොහැකියාවන්ට හේතුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය වශයෙන් ඉස්මතු නොකර, අදාළ සිදුවීම් සහ ක්‍රියාවන් පමණක් විස්තර කරමු. කාන්තාවන් හෑල්ලුවට ලක් කරන ප්‍රස්තාව පිරුළු එදිනෙදා සාමාන්‍ය ව්‍යවහාරයේදී පවා භාවිතා කිරීමෙන් වැළකී සිටිමු. |
| 1.4 | කාන්තාවන් ලිංගිකකරණය කිරීම හෝ බාහිර පෙනුමට අනවශ්‍ය ප්‍රමුඛතාවක් ලබා දීම. | භාෂාව සහ දෘශ්‍ය රූප අදාළත්වය මත පදනම්ව පමණක් යොදා ගනිමු. ක්‍රියාවන්, සාක්ෂි සහ සන්දර්භය කෙරෙහි අවධානය යොමු කරමු; බාහිර පෙනුම ගැන සඳහන් කළ යුත්තේ එය අත්‍යවශ්‍යම නම් පමණි. එය ද පිරිමින් සම්බන්ධයෙන් වාර්තා කරන ආකාරයටම පමණක් සිදු කරමු. |
| 1.5 | කාන්තාවන් සහ කාන්තාවන් බහුලව නියැලෙන වෘත්තීන් හැඳින්වීමට යල්පැනගිය හෝ අවමන්සහගත යෙදුම්, විශේෂයෙන්ම සදාචාරය පිළිබඳ විනිශ්චයන්, පහත් සමාජ මට්ටම හෝ අපහාසය හඟවන යෙදුම් භාවිතා කිරීම. | වෘත්තියට අදාළ නිවැරදි යෙදුම් භාවිතා කරමු. සදාචාරය පිළිබඳ විනිශ්චයකින් තොරව වෘත්තිය විස්තර කරමු (උදා: "ගෘහ සේවිකාව", "ලිංගික ශ්‍රමික"); පුවතට සෘජුවම අදාළ නම් පමණක් වෘත්තිය ගැන සඳහන් කරමු. |

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

# 2 පරිච්ඡේදය: ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවට අදාළ වාර්තාකරණය

මෙම පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකාවේ මාධ්‍ය විසින් ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාව පිළිබඳව වාර්තා කරනු ලබන ආකාරය විමසා බලයි.[39] ප්‍රායෝගිකව ගත් කළ, මෙම පුවත් වාර්තාකරණයන් බෝහෝ විට හැඟීම් කැළඹවන සුළු වාර්තාකරණය, අනුමාන කිරීම්, ඒකාකෘති සහ නිෂේධනාත්මක භාෂා භාවිතය මත රඳා පවතින බව නිරීක්ෂණය වන්නකි. වාර්තා කරනු ලබන සිදුවීමට එම කරුණු අදාළ නොවන අවස්ථාවලදී පවා LGBTQIA+ පුද්ගලයින්ට අදාළ පුවත් මගින් බොහෝ විට ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් හෝ බාහිර පෙනුම ඉස්මතු කර පෙන්වන බවක් දක්නට ලැබේ. මෙවැනි වාර්තාකරණයන් මගින් පුද්ගලයින් පහත් කොට සැලකීම හෝ LGBTQIA+ අනන්‍යතාවන් විකෘති කිරීම හෝ සිදු විය හැකි අතර, එම අවස්ථාවේදී පුවත වශයෙන් කරුණු වෙනුවට අනන්‍යතාව වෙත අවධානය යොමු කිරීමට පාඨකයින් පෙළඹිය හැක.

ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ මේ සම්බන්ධයෙන් පවතින්නේ ඉහළ අවදානමකි. LGBTQIA+ පුද්ගලයින් පුවත පළ වන අවස්ථාව වන විටදීත් සමාජ අපවාදයට ලක් වෙමින් සිටින්නන් විය හැක. එමෙන්ම, ඔවුන් පවුල තුළ කොන් වී, නීතිමය වශයෙන් ද අනාරක්ෂිතභාවයට මුහුණ දෙමින් සිටින්නන් වීමට ඇත්තේ ද වැඩි ඉඩකඩකි. මෙකී සන්දර්භය තුළ, හානියක් කිරීමේ අදහසින් සිදු නොකළ ද, ආචාරධාර්මික නොවන වාර්තාකරණයන් මගින් පුද්ගලයින් හිරිහැරවලට, පවුල් ආරවුල්වලට සහ ශාරීරික අවදානමට නිරාවරණය විය හැකි අතර ඔවුනට රැකියාව ද අහිමි විය හැක.

එබැවින්, මෙහිදී හානිය අවම කිරීම යනු වාර්තාකරණයෙන් බැහැර වීම නොව, වෘත්තීය විනයක් අනුගමනය කිරීමයි. මෙයින් අදහස් කරන්නේ පුද්ගලයින්ව ඒකාකෘති (Stereotypes) ලෙස නොව පුද්ගල මට්ටමින් විස්තර කිරීමයි; අනන්‍යතාව හෙළිදරව් කිරීමෙන් හානියක් විය හැකි අවස්ථාවලදී එය සුරැකීමයි; උපකල්පන මත පදනම් නොවී නිවැරදි පාරිභාෂික වදන් තහවුරු කර ගැනීමයි; සිදුවීම අවබෝධ කර ගැනීමට මහජනතාවට සැබවින්ම උපකාරී වන තොරතුරු පමණක් ඇතුළත් කිරීමයි; සහ මෙම පුද්ගලයින්ව උපහාසයට ලක් කරන, නිරාවරණය කරන හෝ භාවාතිශය අයුරින් නිරූපණය කරන භාෂා හෝ දෘශ්‍ය මාධ්‍ය භාවිතයෙන් වැළකී සිටීමයි.

ප්‍රායෝගිකව ගත් කළ, මෙහිදී මාධ්‍යවේදීන් මඳක් නැවතී මෙසේ විමසීම වැදගත් වේ: *මෙම පුවත පැහැදිලිව විස්තර කිරීමට මෙම කරුණ අවශ්‍ය ද — නැතහොත් එය හුදෙක් එම පුද්ගලයාගේ අනන්‍යතාව වෙත අවධානය යොමු කරවන්නක් පමණක් ද?*

**මූලික ප්‍රතිපත්තිය: LGBTQIA+ පුද්ගලයින් ගෞරවනීය ලෙස නිරූපණය කරමු; හානිකර ඒකාකෘති යොදා ගැනීමෙන් හෝ අනවශ්‍ය ලෙස ඔවුන් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමෙන් වළකිමු.**

## 2.1 විශේෂයෙන්ම සෘණාත්මක සන්දර්භයන්හිදී LGBTQIA+ අනන්‍යතාව ඉස්මතු කිරීම මගින් සිදු කෙරෙන සෘණාත්මක අනන්‍යතා නිරූපණයෙන් (NEGATIVE IDENTITY PROFILING) වැළකී සිටිමු

ශ්‍රී ලාංකේය මාධ්‍ය තුළ, LGBTQIA+ අනන්‍යතාව බොහෝ විට ඉස්මතු කරනු ලබන්නේ තෝරාගත් අවස්ථාවලදී පමණි—විශේෂයෙන්ම අපරාධ, අනතුරු, මරණ හෝ වෙනත් සෘණාත්මක සිදුවීම් පිළිබඳ පුවත් වාර්තා කිරීමේදී මෙය බහුලව දක්නට ලැබේ.[40] ඒ අතරම, වෘත්තීය ජයග්‍රහණ, ප්‍රජා දායකත්වය හෝ එදිනෙදා සාමාන්‍ය ජීවිතය වැනි මධ්‍යස්ථ හෝ ධනාත්මක සන්දර්භයන්හිදී LGBTQIA+ අනන්‍යතාව සඳහන් වන්නේ ඉතා කලාතුරකිනි. මෙය එම අනන්‍යතාව මාධ්‍ය තුළ නිරූපණය කරන ආකාරය සම්බන්ධයෙන් අසමබරතාවක් ඇති කරයි.[41]

මෙලෙස ඇතැම් පුවත් තුළ පමණක් ඔවුන් නියෝජනය කිරීම හේතුවෙන් ඔවුන් නිෂේධනාත්මක චරිත ලක්ෂණ සමඟ ඇසුරු කිරීමට පෙළඹේ. කිසියම් පුද්ගල අනන්‍යතාවක් වැරදි ක්‍රියාවන්, අපකීර්තිමත් සිද්ධියක් හෝ හානිකර සිදුවීම් සමඟ පමණක් නැවත නැවතත් සම්බන්ධ කර දැක්වීම හරහා, "LGBTQIA+ පුද්ගලයින් එවැනි සිදුවීම්වලට සම්බන්ධ

39 ඇසෝසියේටඩ් ප්‍රෙස් (Associated Press), ඇසෝසියේටඩ් ප්‍රෙස් ශෛලී පොත (The Associated Press Stylebook) (55 වැනි සංස්කරණය, 2020) 'ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගිකත්වය' (gender and sexuality).

40 එතික්ස් අයි (Ethics Eye), 'මියගිය තැනැත්තියගේ ඇඳුම පුවතට අදාළ ද?' (වෙරිටේ මීඩියා, ඉන්ස්ටාග්‍රෑම්, 2024 පෙබරවාරි 9), < www.instagram.com/p/C3IQs68BGZ3/ > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

41 ඇජෙන්ස් ෆ්‍රාන්ස්-ප්‍රෙස් (Agence France-Presse), කර්තෘ ප්‍රමිතීන් සහ හොඳම භාවිතයන් (Editorial Standards and Best Practices) (2025 පෙබරවාරි), 12 < www.afp.com/communication/afp_ethic_February_2025.pdf > 2026 පෙබරවාරි 19 දින ප්‍රවේශ විය; බීබීසී කර්තෘ ප්‍රමිතීන් (The BBC's Editorial Standards) (BBC, 2019 ජූනි), 83 < https://downloads.bbc.co.uk/guidelines/editorialguidelines/pdfs/bbc-editorial-guidelines-whole-document.pdf >ප්‍රවේශය 2026 පෙබරවාරි 19.
එතික්ස් අයි (Ethics Eye), '"ටොම්බෝයිස්? ඒකාකෘතික කිරීම අවශ්‍ය ද?' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2024 පෙබරවාරි 9) < www.facebook.com/share/p/17wjM1F4Ti/ > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

වීමට වැඩි ඉඩකඩක් ඇති පිරිසක්ය" යන වැරදි හැඟීම ඇති කළ හැක.[42] එවිට, කාලය ගතවීමත් සමඟ ඒකාකෘතික ආකල්ප තීව්‍ර කිරීමටත්, ඊට සම්බන්ධ නැති වෙනත් සිදුවීම් පවා ප්‍රේක්ෂකයින් අර්ථකථනය කරන ආකාරය කෙරෙහි බලපෑම් ඇති කිරීමටත් මෙය හේතු වේ.

මේ හා සම්බන්ධ තවත් ගැටලුවක් වන්නේ, පුද්ගල අනන්‍යතාව හඳුනාගැනීමේ ලක්ෂණයක් ලෙස බාහිර පෙනුම භාවිතා කිරීමයි. පුද්ගලයෙකුගේ ඇඳුම් පැළඳුම්, කොණ්ඩා මෝස්තරය හෝ වේශ නිරූපණය මගින් එම පුද්ගලයාගේ ලිංගික දිශානතිය (Sexual orientation) හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාව (Gender identity) තහවුරු කළ නොහැක. එවැනි තොරතුරු අනන්‍යතාව තහවුරු කරන සාධක ලෙස ඉදිරිපත් කිරීම හරහා සංකීර්ණ අනන්‍යතාවන් හුදු දෘශ්‍ය ලකුණු කිහිපයකට ලඝු කරනු ලබන අතර, ප්‍රේක්ෂකයින් තුළ සෘණාත්මක ආකල්ප ඇති කිරීමට එය පොළඹවයි.[43]

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- යම් පුද්ගලයෙකුගේ LGBTQIA+ අනන්‍යතාව අදාළ සිදුවීමට හේතු වූ බවක්, ඊට දායක වූ බවක් හෝ සිදු වූ දෙය පැහැදිලි කිරීමට උපකාරී වන බවක් හඟවන්නේ නැති වන පරිදි, සිද්ධියට අදාළ කරුණු පමණක් වාර්තා කරමු.
- බාහිර පෙනුම හරහා පුද්ගල අනන්‍යතාව "තහවුරු කිරීමට" උත්සාහ නොකරමු. පුද්ගලයෙකුගේ ඇඳුම් පැළඳුම්, කොණ්ඩා මෝස්තරය හෝ වේශ නිරූපණය මගින් එම පුද්ගලයාගේ අනන්‍යතාව තහවුරු කළ නොහැකි බැවින්, එවැනි දේ සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීමෙන් වළකිමු.
- LGBTQIA+ අනන්‍යතාව සඳහන් කිරීමට පෙර එහි අදාළත්වය පරීක්ෂා (Relevance test) කර බලමු. එහිදී අදාළ විය යුත්තේ නිවැරදි සහ ධනාත්මක සංස්කෘතික අවබෝධය හෝ භාවිතය මිස, පූර්ව නිගමන, ප්‍රේක්ෂකයා තිගැස්වීමට දරන උත්සාහයන් (Shock value) හෝ අවමන්සහගත ආකල්ප නොවේ.
- පුද්ගල අනන්‍යතාව සැබවින්ම අදාළ වන අවස්ථාවලදී (උදා: වෙනස්කොට සැලකීම්, ප්‍රතිපත්ති හෝ අයිතිවාසිකම් පිළිබඳ පුවත් වාර්තා කිරීමේදී), ඒ පිළිබඳව නිවැරදිව සහ අදාළ සන්දර්භය සහිතව වාර්තා කරමු.

**වාර්තාකරණය සඳහා නිදසුන්**

| භාවිතයෙන් වළකිමු | භාවිතයට ගනිමු |
|---|---|
| *"තායිලන්ත ලිංගික සංක්‍රාන්තිකයා ළඟ එක් කෝටි 20 ලක්ෂයක කුෂ්"[44]* | *"රුපියල් කෝටියක් වටිනා කුෂ් මෙරටට ගෙනා තායිලන්ත ජාතික සැකකරුවෙක් අත්අඩංගුවට ගෙන ඇති බව වාර්තා වේ."* |
| *සන්දර්භය: තමා ලිංගික අපයෝජනයට ලක් කිරීමට උත්සාහ කළ පුද්ගලයා එල්ල කළ ප්‍රහාරයකින් අදාළ තැනැත්තා මිය යාම පිළිබඳ පුවතක් මෙම නිදසුනට අදාළ විය.*<br><br>*සංක්‍රාන්ති ලිංගික තරුණියගෙන් පහර කෑ 62 හැවිරිදි අයෙක් මරුට.[45]* | *තරුණියකට සිදු කිරීමට තැත් කළ ලිංගික අතවරයක් අතරතුර ඇති වූ පහරදීමක් හේතුවෙන් 62 හැවිරිදි පුද්ගලයෙකු ජීවිතක්ෂයට පත්ව තිබේ.* |

42 ඉවෝන් ජුක්ස්, මාධ්‍ය සහ අපරාධ (Media and Crime) (3 වැනි සංස්කරණය, සීමාසහිත සේජ් ප්‍රකාශන (SAGE Publications Ltd) 2015); ලැරී ග්‍රොස්, අදෘශ්‍යමානභාවයෙන් ඔබ්බට: ඇමරිකාවේ සමලිංගික කාන්තාවන්, සමලිංගික පිරිමි සහ මාධ්‍ය (Up from Invisibility: Lesbians, Gay Men, and the Media in America) (කොලොම්බියා විශ්වවිද්‍යාලයේ මුද්‍රණාලය (Columbia University Press 2001))

43 නියල් රිචඩ්සන් සහ ඇඩම් ලොක්ස්, ශරීරය පිළිබඳ අධ්‍යයනය: මූලික කරුණු (Body Studies: The Basics) (1 වැනි සංස්කරණය, රූට්ලෙජ් (Routledge) 2014)

44 එතික්ස් අයි (Ethics Eye), 'මේ සිරස්තල සසඳමු. ඔබ තෝරාගන්නා වාර්තාකරණය කුමක් ද?' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2025 මැයි 23) < www.facebook.com/share/p/17SbYnNNRp/> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

45 එතික්ස් අයි (Ethics Eye), 'ලිංගික අතවරයක් සහ මරණයක්, නමුත් වැඩි අවධානය සංක්‍රාන්ති ලිංගික බවට ද?' (ෆේස්බුක්, 2024 දෙසැම්බර් 18) < www.facebook.com/share/p/1CgeKkPgHa/ > ප්‍රවේශය 2026 අප්‍රේල් 02.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## භාවිතයෙන් වළකිමු

***සන්දර්භය: හික්කඩුවේ හෝටලයක කාර්ය මණ්ඩලය විසින් මළ සිරුරක් සොයා ගත් බවට වූ පුවතක සිරස්තලයට පහත නිදසුන අදාළ වේ. මිය ගිය පුද්ගලයා LGBTQIA+ ප්‍රජාවට අයත් වූවකු යැයි හැඟවීම පිණිස එහිදී භාවාතිශය අයුරුන් කාන්තා යටඇඳුම් පිළිබඳව සදහන් කොට තිබිණි. පුවතට අදාළ නම් පමණක් එම ස්ථානයේ තිබී හමු වූ භාණ්ඩ වශයෙන් එවැනි තොරතුරු පුවතේ ආරම්භයේදී නොව, වෙනත් කොටසක සඳහන් කළ හැක.***

***කාන්තා යට ඇඳුමින් අභිරහස් ලෙස මිය ගිය තරුණයෙකුගේ මළ සිරුර හික්කඩුවේ හෝටලයක.[46]***

## භාවිතයට ගනිමු

**සැකකටයුතු ලෙස මිය ගිය අයෙකුගේ මළ සිරුරක් හික්කඩුවේ හෝටලයක තිබී සොයාගෙන ඇත.**

**මෙය වැදගත් වන්නේ ඇයි?** කිසිදු අයහපත් චේතනාවක් නොමැති අවස්ථාවලදී පවා, යම් පුද්ගලයෙකුගේ අනන්‍යතාව සෘණාත්ම සන්දර්භයන්වලදී පමණක් ඉස්මතු කිරීම මගින් ඔවුන්ට සැබවින්ම හානියක් සිදු විය හැක. ජයග්‍රහණ, ප්‍රජා දායකත්වය හෝ එදිනෙදා සාමාන්‍ය ජීවිතය පිළිබඳ පුවත්වලදී LGBTQIA+ අනන්‍යතාව සඳහන් නොකර, අපරාධ, මරණ හෝ අපකීර්තිමත් සිදුවීම් වැනි සෘණාත්මක සන්දර්භයන්හිදී පමණක් එය නැවත නැවතත් ඉස්මතු කර දැක්වීම හරහා මාධ්‍ය විසින් සමාජ අපවාදය උපදවන රටාවක් නිර්මාණය කරනු ලබයි.[47] කාලය ගතවීමත් සමඟ, කිසියම් එක් ප්‍රකාශයක් නිසා නොව, මෙලෙස සෘණාත්මක සිදුවීම් සමඟ අනන්‍යතාව දිගින් දිගටම සම්බන්ධ කිරීම හේතුවෙන් LGBTQIA+ ප්‍රජාව සමාජ සම්මතයෙන් බැහැර වූවන් පිරිසක් ලෙස පෙනී යා හැක.

## 2.2 අපහාසාත්මක යෙදුම්, උපහාසය උපදවන සහ “අසාමාන්‍යතාව” හුවා දක්වන භාෂා භාවිතයෙන් වැළකී සිටිමු

LGBTQIA+ අනන්‍යතාව කිසියම් පුවතකට අදාළ බව එම පුවත සම්පාදනය කිරීමේදී තීරණය වූ පසු, මීළඟට පැන නගින ගැටලුව වන්නේ එය විස්තර කරන්නේ කෙසේ ද යන්නයි.[48] ලංකාවේ මාධ්‍ය වාර්තාකරණය තුළ බොහෝ විට හානියක් සිදු වන්නේ මෙන්න මේ අවස්ථාවේදීය — එය අනිවාර්යයෙන්ම චේතනාන්විතව සිදු වන්නක් නොව, දීර්ඝ කාලීනව භාවිතා වන වාග් මාලාවක් (Vocabulary) භාවිතා කිරීම නිසා සිදු වන්නක් විය හැක.

සිංහල භාෂාවේ භාවිතා වන “සමනළයා” වැනි යෙදුම් හෝ “අසාමාන්‍ය” සහ “අස්වාභාවික” වැනි නිරූපණයන් LGBTQIA+ පුද්ගලයින් හඳුන්වා දීමට යොදා ගත හැකි මධ්‍යස්ථ යෙදුම් නොවේ.[49] LGBTQIA+ අනන්‍යතාවන් දෝෂ සහිත, හාස්‍යජනක හෝ සදාචාරාත්මක වශයෙන් ප්‍රශ්නකාරි බවට වන නිගමනයන් ඒ තුළ අන්තර්ගතව පවතී. සාමාන්‍ය ව්‍යවහාරයේදී හෝ වෙනත් අයෙකුගේ ප්‍රකාශයක් උපුටා දැක්වීමේදී වුව ද පුවත් වාර්තා කිරීමේදී මෙවැනි යෙදුම් භාවිතා කිරීම හේතුවෙන් එම නිගමනයන් නිවැරදි කරුණු වශයෙන් සමාජගත වේ.

46 එතික්ස් අයි (Ethics Eye), ‘මෙම වාර්තාකරණය පිළිබඳ ඔබේ අදහස?’ (ෆේස්බුක්, 2024 පෙබරවාරි 02) <www.facebook.com/share/1c-68gFEsUg/ > ප්‍රවේශය 2026 අප්‍රේල් 02.

47 බෲස් ජී. ලින්ක් සහ ජෝ සී. ෆීලාන්, ‘අවමානය සංකල්පගත කිරීම’ (Conceptualizing Stigma) (2001) 27 ඇනුවල් රිවිව් ඔෆ් සෝෂියෝලජි (Annual Review of Sociology) 363 < Conceptualizing Stigma | Annual Reviews > ප්‍රවේශය 2026 අප්‍රේල් 6.

48 ‘ලිංගික, වාර්ගික, ආගමික හෝ වෙනත් ඒකාකෘති තහවුරු කරන භාෂාව භාවිතා නොකරන්න. එවැනි භාෂාව අප්‍රසන්න වන අතර, එය යල් පැන ගිය සහ බොහෝ විට සරලවම, සාවද්‍ය වේ.’ රොයිටර්ස් (Reuters), පුවත්පත් කලාව පිළිබඳ අත්පොත (Handbook of Journalism) (2015); බීබීසී කර්තෘ ප්‍රමිතීන් (The BBC’s Editorial Standards) (BBC, 2019 ජූනි), 83 < https://downloads.bbc.co.uk/guidelines/editorialguidelines/pdfs/bbc-editorial-guidelines-whole-document.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

49 වෙරිටේ මීඩියා (Verité Media), ‘අසාමාන්‍යතාව’ (ඉන්ස්ටාග්‍රෑම්, 2025 ඔක්තෝබර් 14), < > ප්‍රවේශය 2026 අප්‍රේල් 02.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

මෙම මතය විද්‍යාත්මක සම්මතයන් මගින් සෘජුවම ප්‍රතික්ෂේප කරනු ලැබේ.[50] ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 1990 වසරේදී සමලිංගිකත්වය මානසික ආබාධ සඳහා වන වර්ගීකරණයෙන් ඉවත් කරන ලදි.[51] ඇමරිකානු මනෝචිකිත්සක සංගමය ද 1973 වසරේදී එම නිගමනයටම එළැඹී තිබිණි.[52] එබැවින්, LGBTQIA+ අනන්‍යතාවන් රෝගී තත්ත්වයක් හෝ විකෘතියක් ලෙස හැඳින්වීම හුදෙක් පුවත සම්පාදනය කිරීමේදී ගන්නා[53] තීරණයක් පමණක් වශයෙන් සැලකිය නොහැක-එය එසේ නිරූපණය කිරීම සැබවින්ම සාවද්‍ය වේ.

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

<table>
<tr><th>මෙම යෙදුම් භාවිතයෙන් වළකිමු</th><th>මෙම යෙදුම් භාවිතයට ගනිමු[54]</th></tr>
<tr><td>නපුංසක[55]</td><td rowspan="3">සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයා<br>සංක්‍රාන්තික කාන්තාව<br>සංක්‍රාන්තික පුරුෂයා<br>සමරිසි පුද්ගලයා / සමරිසි තැනැත්තා</td></tr>
<tr><td>සමනළයා - සමලිංගික සබඳතාවල නියැලෙන පිරිමින් සමච්චලයට ලක් කිරීමට හෝ ඔවුන් ස්ත්‍රී ස්වරූපයෙන් හැඳින්වීම සඳහා බහුලව භාවිතා වන යෙදුමකි.[56]</td></tr>
<tr><td>ස්ත්‍රී පුරුෂ සමාජභාවය හෝ ලිංගික අනන්‍යතාව විහිළුවක්, වෙස්වලා ගැනීමක් හෝ රැවටීමක් ලෙස සලකන යෙදුම් සහ රාමුගත කිරීම් (උදාහරණයක් ලෙස: LGBTQIA+ පුද්ගලයින් සහ සමලිංගික සබඳතා විස්තර කිරීම සඳහා “අසාමාන්‍ය” හෝ “අස්වභාවික” වැනි යෙදුම් භාවිතා කිරීම).[57]</td></tr>
</table>

50 ජැක් ඩ්‍රෙෂර්, ‘DSM වෙතින් බැහැරට: සමලිංගිකත්වය රෝගී තත්ත්වයක් ලෙස වර්ගීකරණය කිරීමෙන් ඉවත් කිරීම’ (Out of DSM: Depathologising Homosexuality) (2015) බිහේවියරල් සයන්සස් (Behavioural Sciences) 5(4) 565–575 < www.mdpi.com/2076-328X/5/4/565 > ප්‍රවේශය 2026 පෙබරවාරි 19; රෙබෙකා රොබ්ලස් සහ කණ්ඩායම, ‘මානසික ආබාධ වර්ගීකරණයෙන් සංක්‍රාන්තික සමාජභාවී අනන්‍යතාව ඉවත් කිරීම: ICD-11 සඳහා මෙක්සිකානු ක්ෂේත්‍ර අධ්‍යයනයක්’ (Removing Transgender Identity from the Classification of Mental Disorders: A Mexican Field Study for ICD-11) (2016) 3(9) ද ලැන්සට් සයිකයැට්‍රි (The Lancet Psychiatry) 850–859 < www.thelancet.com/journals/lanpsy/article/PIIS2215-0366(16)30165-1/abstract > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

51 ලෝක සෞඛ්‍ය සංවිධානයේ යුරෝපීය කලාපීය කාර්යාලය (World Health Organization Regional Office for Europe), ‘සංක්‍රාන්තික සමාජභාවී ප්‍රජාවගේ යහපත් සෞඛ්‍යය සහ අයිතිවාසිකම් වෙනුවෙන් තවත් එක් පියවරක් ඉදිරියට (Moving One Step Closer to Better Health and Rights for Transgender People’(’ (පුවත් නිවේදනය, 2019 මැයි 17) < www.who.int/europe/news/item/17-05-2019-moving-one-step-closer-to-better-health-and-rights-for-transgender-people > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

52 බැරී මැන්, ‘ඇමරිකානු මනෝචිකිත්සක සංගමය සමලිංගිකත්වය මනෝචිකිත්සක ආබාධ ලැයිස්තුවෙන් ඉවත් කරයි’ (American Psychiatric Association Delists Homosexuality as a Psychiatric Disorder) (ඒබ්ස්කො රිසර්ච් ස්ටාර්ටර්ස් (EBSCO Research Starters), 2023) < www.ebsco.com/research-starters/psychology/american-psychiatric-association-delists-homosexuality-psychiatric > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

53 ජැක් ඩ්‍රෙෂර්, ‘DSM වෙතින් බැහැරට: සමලිංගිකත්වය රෝගී තත්ත්වයක් ලෙස වර්ගීකරණය කිරීමෙන් ඉවත් කිරීම’ (Out of DSM: Depathologising Homosexuality) (2015) බිහේවියරල් සයන්සස් (Behavioural Sciences) 5(4) 565–575 < www.mdpi.com/2076-328X/5/4/565 > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

54 එක්විටි ශ්‍රී ලංකා (Équité Sri Lanka), බ්‍රිජ් ෆෝ ඊක්වලිටි (Bridge for Equality), රජරට ගැමි පහණ, ශ්‍රී ලංකාවේ LGBTI+ පුද්ගලයින්ගේ තත්ත්වය පිළිබඳ සර්වත්‍ර කාලීන සමාලෝචනය (UPR) සඳහා රාජ්‍ය නොවන සංවිධාන විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ වාර්තාව (Situation of LGBTI+ persons in Sri Lanka Joint NGO Submission to the Universal Periodic Review ) (2025) <https://equitesrilanka.org/wp-content/uploads/2025/05/Situation-of-LGBTI-persons-in-Sri-Lanka-42nd-session-of-the-Submission-to-the-Universal-Periodic-Review-Sinhala.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 27.
ඩිලීට් නතින් (DELETE NOTHING), පාරිභාෂික ශබ්ද මාලාව (Glossary Sheet), <https://mcusercontent.com/a8d8675d007dc3a9d2e17fe38/files/7b9c78e3-24ba-d4bd-15c1-0c3a7c9a2b8d/Delete_Nothing_Glossary_Sheet1.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 27.

55 එතික්ස් අයි (Ethics Eye), ‘සංක්‍රාන්ති ෆෝබියාව කරා යා හැකි වාර්තාකරණයක්?’ (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2024 මැයි 30) < www.facebook.com/share/p/1ASdrKZTNM//> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

56 එතික්ස් අයි (Ethics Eye). සමලිංගික සබඳතාවල නිරත වන පුද්ගලයින් “සමනළුන්” ලෙස හඳුන්වන්නේ ඇයි? 2023 සැප්තැම්බර් 27, https://www.instagram.com/p/CxshqskB6ZL/.

57 එතික්ස් අයි (Ethics Eye), ‘සමලිංගික සබඳතාවල නිරත වන පුද්ගලයින් “සමනළුන්” ලෙස හඳුන්වන්නේ ඇයි?’ (වෙරිටේ මීඩියා, ඉන්ස්ටාග්‍රෑම්, 2023 සැප්තැම්බර් 27) < www.instagram.com/p/CxshqskB6ZL/> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

| මෙම යෙදුම් භාවිතයෙන් වළකිමු | මෙම යෙදුම් භාවිතයට ගනිමු[54] |
| --- | --- |
| ***විකෘති[58]*** | ***LGBTQIA+ පුද්ගලයා හෝ සරලවම, දිශානතිය අදාළ නැති අවස්ථාවලදී "පුද්ගලයා" යන යෙදුම පමණක්.*** |

**මෙය වැදගත් වන්නේ ඇයි?** භාෂාව යනු ප්‍රේක්ෂකයින් වෙනත් පුද්ගලයින්ට සලකන ආකාරය තීරණය කරන මූලික සාධකයකි. මධ්‍යස්ථ සහ නිවැරදි යෙදුම් භාවිතා කිරීම මගින් වළක්වා ගත හැකි සමාජ අපවාදයන් අවම වන අතර, එමගින් හානිය අවම කිරීම යන මෙම අත්පොතට පදනම්ව ඇති මූලධර්මය තහවුරු කෙරේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වැනි රටක, ප්‍රසිද්ධියේ ඉහත සඳහන් යෙදුම් ඇසුරින් හඳුන්වා දීම හේතුවෙන් LGBTQIA+ පුද්ගලයින්ට හිරිහැරවලට මුහුණ දීමට සිදු විය හැක. එමෙන්ම, රැකියාවන් අහිමි වීමටත්, ඔවුන් පවුලෙන් ප්‍රතික්ෂේප වීමටත්, ශාරීරික අවදානම්වලට නිරාවරණය වීමටත් එය හේතුවක් විය හැක. තව ද, සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින් සම්බන්ධයෙන් මාධ්‍ය විසින් පළ කරනු ලබන සෘණාත්මක හෝ ඒකාකෘතිවලට අදාළ පණිවිඩවලට නිරාවරණය වීම, වැඩිහිටි සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින්ගේ මානසික සෞඛ්‍යය පිරිහීමට (අධික කාංසාව සහ විෂාදය ඇතුළුව) සෘජුවම බලපාන බව පර්යේෂණ මගින් පෙන්වා දී ඇත.[59]

## 2.3 LGBTQIA+ පුද්ගලයින් නිරූපණය කිරීමේදී ගෞරවය හඟවන දෘශ්‍ය රූප තෝරා ගනිමු

LGBTQIA+ පුද්ගලයින් පිළිබඳව වැරදි චිත්‍රයක් මවා පෑමට බහුලවම බලපාන එක් හේතුවක් වන්නේ ඔවුන් දෘෂ්‍ය රූප ඇසුරින් නිරූපණය කරන ආකාරයයි. මාධ්‍ය විසින් නිතරම උපහාසාත්මක රූප, ලිංගිකත්වය ඉඟි කරන කුඩා රූප (Thumbnails - විශේෂයෙන්ම අන්තර්ජාලය තුළ) හෝ අවසරයකින් තොරව පුද්ගලික සමාජ මාධ්‍ය ගිණුම්වලින් ලබාගත් ඡායාරූප භාවිතා කරනු ලැබේ. මෙම භාවිතයන් මගින් පුද්ගල අනන්‍යතාව හෑල්ලූ කළඹවන අයුරින් නිරූපණය කෙරෙන අතර, පුද්ගලයින්ගේ කැමැත්තකින් තොරව ඔවුන්ගේ අනන්‍යතාව ප්‍රසිද්ධ කිරීම හරහා ඔවුන් අවදානමට ලක් විය හැක.

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- පුද්ගලික සමාජ මාධ්‍යවලින් ලබාගත් තිර ඡායාරූප ද (Screenshots) ඇතුළුව, කැමැත්තකින් තොරව පුද්ගල අනන්‍යතාව හෙළිදරව් කරන කිසිදු රූපයක් කිසිවිටෙකත් භාවිතා නොකරමු.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රකාශනයන් (Gender expression) සමච්චලයට ලක් කරන උපහාසාත්මක රූප හෝ කාටූන් භාවිතයෙන් වළකිමු. මෙවැනි අතිශයෝක්තියට නැංවීම් මගින් හානිකර ඒකාකෘති තීව්‍ර කෙරෙන අතර අදාළ පුද්ගලයින් සමච්චලයට ලක් කෙරේ.
- මධ්‍යස්ථ සහ සන්දර්භයට ගැලපෙන දෘශ්‍ය රූප භාවිතා කරමු. උදාහරණයක් ලෙස: අඳුරු සේයා රූ (Silhouettes), සංකේතාත්මක රූප (උදා: අභිමානයේ ධජය) හෝ යම් කිසි ස්ථානයක සාමාන්‍ය දර්ශන.

**මෙය වැදගත් වන්නේ ඇයි:** ලිපියක් කියවීමට පෙර පාඨකයා වෙත ළඟා වන්නේ එහි අඩංගු දෘශ්‍ය නිරූපණයන්ය. ගෞරවය හඟවන රූප භාවිතා කිරීම මගින් පුද්ගලයින් අනවශ්‍ය ලෙස නිරාවරණය වීම, සමච්චලයට ලක්වීම හෝ කැමැත්තකින් තොරව අනන්‍යතාව හෙළිදරව් වීම වළක්වන අතර, එය මෙම ලේඛනයේ හැඳින්වීමෙහි දක්වා ඇති වෘත්තීය මූලධර්මවලට ද සෘජුවම අනුබල දෙයි.

58 එතික්ස් අයි (Ethics Eye), 'සමලිංගිකත්වය විකෘතියක් ද?' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2025 ඔක්තෝබර් 13) < www.facebook.com/share/p/1DPbkf7bPR/ > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

59 ජැක්ලින් එම්. ඩබ්ලිව්. හියුටෝ සහ තවත් අය, 'සංක්‍රාන්තික සමාජභාවී ප්‍රජාවට අදාළ සෘණාත්මක මාධ්‍ය පණිවිඩ සහ අහිතකර මානසික සෞඛ්‍ය ප්‍රතිඵල අතර පවතින සබඳතාව: සංක්‍රාන්තික සමාජභාවී වැඩිහිටියන් ඇසුරින් කළ බහු-රාජ්‍ය අධ්‍යයනයක්' (Negative Transgender-Related Media Messages Are Associated with Adverse Mental Health Outcomes in a Multistate Study of Transgender Adults) (2021) 8 එල්ජීබීටී හෙල්ත් (LGBT Health) 32 < https://doi.org/10.1089/lgbt.2020.0279 > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## සාරාංශය - ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවට අදාළ වාර්තාකරණය සඳහා පිරික්සුම් ලැයිස්තුව

| | භාවිතයෙන් වළකිමු | පිළිපදිමු |
|---|---|---|
| **2.1** | *සෘණාත්මක සන්දර්භයන් තුළදී පමණක් LQBTQIA+ අනන්‍යතාව ඉස්මතු කිරීම (අපරාධ, හදිසි අනතුරු, මරණ, අපකීර්තිමත් සිදුවීම්).* | *අදාළත්වය පරීක්ෂා කර බලමු: අදාළ සිදුවීම අවබෝධ කරගැනීමට ප්‍රේක්ෂකයින්ට උපකාරී වන අවස්ථාවලදී සහ පුවතේ සංස්කරණ අරමුණුවලට අදාළ වන අවස්ථාවලදී පමණක් අනන්‍යතාව පළ කරමු.* |
| **2.2** | *අපහාසාත්මක වචන, උපහාසයට ලක් කිරීම හෝ "අසාමාන්‍ය/විකෘති" යන යෙදුම් භාවිතය (උදා: නපුංසක, සමනළයා, අසාමාන්‍ය, අස්වභාවික, විකෘති වැනි යෙදුම්).* | *අදාළ වන අවස්ථාවලදී අනන්‍යතාව දැක්වීමට නිවැරදි යෙදුම් භාවිතා කරමු (උදා: සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයා / සංක්‍රාන්තික කාන්තාව / සංක්‍රාන්තික පුරුෂයා / සමරිසි පුද්ගලයා) හෝ සරලවම, අනන්‍යතාව අදාළ නොවන විට "පුද්ගලයා" යන වචනය භාවිතා කරමු.* |
| **2.3** | *උපහාසාත්මක චිත්‍ර (Caricatures), ලිංගිකත්වය ඉඟි කරන කුඩා රූප (Thumbnails) හෝ පුද්ගල අනන්‍යතාව හෙළි කරන පෞද්ගලික සමාජ මාධ්‍ය ඡායාරූප අවසරයකින් තොරව භාවිතා කිරීම.* | *අනන්‍යතාව නිරාවරණය නොකර ප්‍රවෘත්තියේ අරමුණට සහය දක්වන දෘශ්‍ය රූප භාවිතා කරමු; පුද්ගලයින් සමච්චලයට ලක් කිරීමෙන් වළකිමු; සන්දර්භයට ගැලපෙන හෝ විශේෂිත නොවන දෘශ්‍ය රූප භාවිතයට ප්‍රමුඛතාව දෙමු.* |

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

# 3 පරිච්ඡේදය: ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තාකරණය

ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තාකරණය ජනමාධ්‍යකරණයේ පවතින වඩාත්ම සංවේදී විෂය පථයන්ගෙන් එකකි. මෙම අපරාධ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (Gender Based Violence – GBV) යන පුළුල් කාණ්ඩයට අයත් වේ — එනම් කාන්තාවන්ට, ගැහැණු දරුවන්ට මෙන්ම සංක්‍රාන්තික සමාජභාවී සහ අන්තර්ලිංගික (Intersex) පුද්ගලයින් ඇතුළු ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විවිධත්වයක් සහිත පුද්ගලයින්ට අසමාන ලෙස බලපාන ප්‍රචණ්ඩත්වයේ ස්වරූපයන් මේ යටතේ සාකච්ඡා කෙරේ. මෙම අසමානතාව පවතින්නේ සමාජය තුළ මුල් බැසගත් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානාත්මතාවන්, බල තුලනයේ පවත්නා විෂමතාවන්, සංස්කෘතික සම්මතයන් සහ සමාජ අපවාදය හේතුවෙනි; මෙම කරුණු එක්ව ගත් කළ ප්‍රචණ්ඩත්වය සිදුවීමේ අවදානම වැඩි කරන අතර, අදාළ සිදුවීමට මුහුණ දුන් පුද්ගලයින් අත්විඳින ප්‍රතිවිපාක ද වඩා දරුණු අතට හරවයි.[60]

ශ්‍රී ලංකාව තුළ, ලිංගික අපරාධවලට ගොදුරු වූ පුද්ගලයින්/වින්දිතයින් බොහෝ විට දැඩි සමාජ විනිශ්චයකට, හිරිහැරවලට හෝ සමාජයේ දැඩි විමර්ශනයට/සෝදිසියට ලක්වේ. ලිංගික අපරාධවලට ගොදුරු වූ ළමුන් — විශේෂයෙන්ම ගැහැණු දරුවන් — සම්බන්ධ අවස්ථාවලදී මෙම තත්ත්වය වඩාත් ඉස්මතු වනු දැකිය හැක. වගකීමකින් තොරව සිදු කරනු ලබන වාර්තාකරණය මගින් ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ පුද්ගලයින්ගේ  අනන්‍යතාවට සහ මානසික සුවතාවයට දැඩි හානි සිදුවිය හැක. දරුවෙකුගේ අනන්‍යතාව වක්‍රාකාරව හෝ හෙළිදරව් කිරීම මගින් එම දරුවා හුදකලා වී හෝ අපහාසයට හෝ සමච්චලයට ලක් වී, ඔවුන් “යළි-අපයෝජනයට” (Re-abuse) ලක් විය හැකි බව ජාතික ළමා අරක්ෂක අධිකාරිය විසින් නිකුත් කරන ලද “ළමා අපයෝජනය පිළිබඳ වාර්තාකරණය සඳහා වන අත්පොත” පෙන්වා දෙයි. එමගින් දීර්ඝකාලීන දරුණු මානසික හානි ද සිදු විය හැකි බව එම අත්පොත තවදුරටත් සඳහන් කරයි.[61]

**මූලික ප්‍රතිපත්තිය: අපරාධයට ගොදුරු වූ පුද්ගලයින්ගේ ගෞරවාන්විතබව සුරැකෙන සේ, ගෞරවය හඟවන අයුරින් ඔවුන් නිරූපණය කරමු.**

## 3.1 සංස්කෘතික වශයෙන් සාමාන්‍යකරණය වී තිබුණ ද, අපහාසාත්මක හෝ නින්දාසහගත වචන භාවිතයෙන් වැළකෙමු

ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ පුවත් වාර්තා කිරීමේදී බොහෝ විට ඊට මුහුණ දුන් පුද්ගලයා “අපවිත්‍ර වී ඇති” හෝ “නම්බුව නැති කර ගත්” හෝ සිදුවූ දෙයට යම් ආකාරයකින් වගකිව යුතු බව හෝ හඟවන යෙදුම් භාවිතා කරනු ලැබේ. මෙම හානිකර මතවාදයන් ගොඩ නැඟී ඇත්තේ සමාජ අපවාදය මත මිස නිවැරදි කරුණු මත නොවේ. සදාචාරාත්මක ජනමාධ්‍යකරණය මෙවැනි රාමුගත කිරීම් ප්‍රතික්ෂේප කරන අතර, මානුෂීය ගුණය සහ ගෞරවය රැකෙන පරිදි විමසා බලා භාෂාව භාවිතා කරයි.[62]

සිංහල මාධ්‍ය වාර්තාකරණයේදී බොහෝ විට “දූෂණය” සහ “කෙලෙසීම” වැනි වචන භාවිතා කිරීම දක්නට ලැබේ. මෙම යෙදුම් තුළ සමාජ අපවාදය ගැබ්ව ඇති අතර, එමගින් අවධානය වැරදිකරුගේ අපරාධකාරී සහ සදාචාර විරෝධී ක්‍රියාවෙන් ඉවතට යොමු කරනු ලැබේ.

දණ්ඩ නීති සංග්‍රහය තුළ ලිංගික අපරාධය (Rape) අර්ථ දැක්වීම සඳහා “ස්ත්‍රී දූෂණය” යන වචනය භාවිතා කළ ද, මහජන පුවත් වාර්තාකරණයේදී එවැනි අවමන්සහගත යෙදුම් නැවත නැවත භාවිතා කිරීමට මාධ්‍යවේදීන් බැඳී නැත. ලැජ්ජාව හෝ සමාජ අපවාදය වර්ධනය නොවන පරිදි, අදාළ අපරාධය පැහැදිලිව සහ නිවැරදිව විස්තර කරන යෙදුම් භාවිතා කිරීම මෙහිදී අනුගමනය කිරීමට සුදුසු වෘත්තීමය ප්‍රවේශය වේ.

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- අපරාධයට ගොදුරු වූ තැනැත්තා කේන්ද්‍ර කරගත් (Survivor-centred) යෙදුම් භාවිතා කරමු.

60 අවර් වොච් (Our Watch), <ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතාවය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අතර පවතින සබඳතාව> (The Link Between Gender Inequality and Violence Against Women) https://www.ourwatch.org.au/link-between-gender-inequality-and-violence ප්‍රවේශය 2026 පෙබරවාරි 27.

61 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ළමා අපයෝජනය පිළිබඳ වාර්තාකරණය: මාධ්‍යවේදීන් සඳහා වූ අත්පොත, (2012) https://childprotection.gov.lk/images/news/Reporting_on_Child_Abuse.pdf ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

62 ‘කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට හෝ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණ දුන් පුද්ගලයින් කිසිවිටෙකත් (ඡායාරූප සහ රූපරාමු ද ඇතුළුව) අසරණ වින්දිතයන් ලෙස නිරූපණය නොකරන්න. ඒ වෙනුවට, ඔවුන් ඒ පිළිබඳව හඬ නැගීමට තීරණය කළ දිවි ගලවා ගත්තවුන් (survivors) ලෙස නිරූපණය කරන්න’ යුනිසෙෆ් (UNICEF), කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වගකීම්සහගත ලෙස නිරූපණය කිරීම සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ (Guidelines on Responsible Representation and Reporting of Violence against Women and Violence against Children) (2021) <https://www.unicef.org/rosa/media/11631/file/Guidelines%20on%20Responsible%20representation%20and%20reporting%20of%20violence%20against%20women%20and%20violence%20against%20children.pdf> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

<table>
<tr><th>මෙම යෙදුම් භාවිතයෙන් වළකිමු</th><th>මෙම යෙදුම් භාවිතයට ගනිමු</th></tr>
<tr><td rowspan="5">දූෂණය<br><br>කෙලෙසීම<br><br>අපරාධයට ගොදුරු වූ පුද්ගලයා “කෙලෙසී ඇති බව”, “විනාශ වී ඇති බව” හෝ “පලුදු වී ඇති බව” හඟවන ඕනෑම යෙදුමක්.</td><td>ලිංගික අපරාධ — මෙය අපරාධය වෙත අවධානය යොමු කරන, මධ්‍යස්ථ යෙදුමක් වන අතර ඕනෑම ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවක් හැඳින්වීමට පොදුවේ භාවිතා කළ හැක.</td></tr>
<tr><td>ලිංගික ප්‍රචණ්ඩත්වය — අදාළ ක්‍රියාව බලහත්කාරකමක් බව අවධාරණ කරන අතර ලිංගික අපරාධවලට ආවේණික බල තුලනයේ අසමානතාව ද ඉස්මතු කරයි.</td></tr>
<tr><td>ලිංගික අතවර — පුළුල් ලෙස පිළිගත් යෙදුමක් වන අතර, එකඟතාවකින් තොරව සිදුවන විවිධ ලිංගික ක්‍රියාවන් පරාසයක් මීට ඇතුළත් වේ. එමෙන්ම මෙය අපරාධයට මුහුණ දුන් පුද්ගලයා වෙත සංවේදිබවක් දැක්වීමේ ප්‍රවේශයකි.</td></tr>
<tr><td>ලිංගික අඩන්තේට්ටම් — බරපතල ලිංගික විෂමාචාර හෝ අපයෝජන සඳහා සමාජය තුළ බහුලව භාවිතයේ පවතින යෙදුමකි; මෙය එකඟතාවකින් තොරව සිදුවන විවිධ ලිංගික ක්‍රියාවන් පරාසයක් සඳහා භාවිතා කිරීමට උචිත වේ.</td></tr>
<tr><td>බලහත්කාර ලිංගික සංසර්ගය — පැහැදිලි හා නීත්‍යානුකූලව විස්තරාත්මක යෙදුමක් වන අතර, “කෙලෙසීමක්” වැනි අදහසක් ඉන් හැඟවෙන්නේ නැත.</td></tr>
</table>

වාර්තාකරණය සඳහා උදාහරණ

| භාවිතයෙන් වළකිමු | භාවිතයට ගනිමු |
|---|---|
| *“අට හැවිරිදි දැරිය දූෂණය කළ PCට වසර 14ක සිර දඬුවමක්.”*[63] | *“බාල වයස්කාර දැරියක ලිංගික අපයෝජනයට ලක් කළ පොලිස් කොස්තාපල්ට වසර 14ක සිර දඬුවමක් නියම වී ඇති බව වාර්තා වේ.”* |

**මෙය වැදගත් වන්නේ ඇයි?** භාවිතා කරනු ලබන භාෂාව මහජන මතය හැඩගැස්වීමට බලපායි. අපරාධයට ගොදුරු වූ පුද්ගලයා කේන්ද්‍ර කරගත්, විනිශ්චය කිරීම්වලින් තොර යෙදුම් භාවිතා කිරීම මගින් සමාජ අපවාදය අභියෝගයට ලක් කළ හැකි අතර, සිදුවීමේ වගකීම වැරදිකරු සතු බව තහවුරු කරයි. එමෙන්ම එම ක්‍රියාව අපරාධයක් බව වටහා ගැනීමට එය මහජනතාවට සහය වන අතර, ලැජ්ජාවට පත්වීමේ බියකින් තොරව යුක්තිය පතා ඉදිරිපත් වීමට අපරාධයට ගොදුරු වූ පුද්ගලයින් දිරිමත් කරයි.

63 එතික්ස් අයි (Ethics Eye), ‘දූෂණය වෙනුවට අපයෝජනය’ (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2025 ඔක්තෝබර් 2) < www.facebook.com/share/p/17vALfciGb/> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## 3.2 ප්‍රචණ්ඩත්වය සුළු කොට තැකීමෙන් හෝ භාවාතිශය ලෙස වාර්තා කිරීමෙන් වැළකෙමු

ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ පුවත් වාර්තා කිරීමේදී හාස්‍යජනක යෙදුම්, වචන හරඹ (Wordplay), ව්‍යංගාර්ථ (Euphemisms) හෝ අතිශයෝක්තියට නංවන භාෂා ශෛලියක් භාවිතා කිරීම මගින් එම සිදුවීමෙහි පවතින බරපතලකම හීන වී යා හැක.[64]

එමෙන්ම, එවැනි වාර්තාකරණ ක්‍රම මගින් අපරාධයට ගොදුරු වූ පුද්ගලයාගේ අවංකභාවය පිළිබඳව සැකයක් ඇති කිරීමට ද ඉඩ සැලසේ. "ළමා අපයෝජනය පිළිබඳ වාර්තාකරණය සඳහා වන අත්පොතෙහි" ඇතුළත් මාර්ගෝපදේශයන් මේ සම්බන්ධයෙන් දැඩිව අනතුරු අඟවන අතර, එහි සඳහන් වන්නේ "භාවිතා කරන ස්වරය සහ රාමුගත කිරීම මගින් පවා පුද්ගලයා යළි-අපයෝජනයට (Re-abuse) ලක්විය හැකි" බවයි.[65]

මෙරට නිරීක්ෂණය වන ඇතැම් පුවත්වල ලිංගික අපරාධ විස්තර කිරීම සඳහා වචන හරඹ හෝ ව්‍යංගාර්ථ භාවිතා කරනු ලබන අතර, එමගින් එකී සිදුවීමේ බරපතලකම යටපත් වී, අපරාධයක් සිදුවී ඇති බව ද වසන් කරනු ලැබේ. උදාහරණයක් ලෙස, බස් රථයක් තුළ සිදු වූ ලිංගික හිරිහැරයක් පිළිබඳ පුවතක සිරස්තලය සඳහා "බස් එක ඇතුළෙදි ගිටාර් ශිල්පියා ගායිකාව ටියුන් කරන්න ගිහින්" යන්න භාවිතා කර තිබිණි.[66] බතික් නිර්මාණකරුවෙකු සහ විලාසිතා නිර්මාණ ශිල්පය හදාරන ශිෂ්‍යාවක සම්බන්ධ තවත් පුවතක, ලිංගිකව ස්පර්ශ කිරීම විස්තර කිරීම වෙනුවට "අමුතු මෝස්තරයක් දාලා" යන්න භාවිතා කර තිබිණි.[67]

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- අපරාධයක බරපතලකම සැහැල්ලු කරන භාෂා ශෛලීන් භාවිතා කිරීමෙන් වළකිමු.

**වාර්තාකරණය සඳහා උදාහරණ**

| භාවිතයෙන් වළකිමු | භාවිතා කරමු |
| --- | --- |
| *"බස් රථ තුනකදී තරුණියකට හදි කළ අනංගයා පොලිසිය අසලදීම කොටු කර ගනී."[68]* | *"බස් රථ තුනකදී තරුණියකට ලිංගික අතවර කළ සැකකරු පොලිසිය අසලදීම කොටු කර ගනී."* |

**මෙය වැදගත් වන්නේ ඇයි?** සිදුවීම් සුළු කොට තකන අයුරින් භාෂාව භාවිතා කිරීම මගින් සැබෑ තත්ත්වය විකෘති වන අතර, ලිංගික ප්‍රචණ්ඩත්වය අවම කොට තැකීමේ සංස්කෘතියක් දිරි ගන්වයි. පැහැදිලිව සහ සෘජුව අදහස සන්නිවේදනය කරන යෙදුම් භාවිතා කිරීම මගින් අදාළ අපරාධයේ පවතින බරපතලකම මැනවින් ප්‍රකාශ වන අතර, අපරාධයට ගොදුරු වූ පුද්ගලයින්ගේ අත්දැකීමට ද එමගින් ගෞරවයක් හිමි වේ.

## 3.3 අපරාධයට ගොදුරු වූ තැනැත්තාගේ අනන්‍යතාව සුරකිමු

අපරාධයට මුහුණ දුන් පුද්ගලයාගේ අනන්‍යතාව ආරක්ෂා කිරීම නීතිමය බැඳීමක් මෙන්ම සදාචාරාත්මක අවශ්‍යතාවකි. නොදැනුවත්ව අනන්‍යතාව අනාවරණය වීම නිසා ඔවුන්ට හිරිහැරවලට මුහුණ පෑමට සිදුවිය හැකි අතර, සමාජයෙන් හුදකලා වීමත්, දීර්ඝකාලීන මානසික හානි පමුණුවීමත් සිදු විය හැක.[69]

64 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ මාධ්‍ය වාර්තාකරණය සඳහා වූ මාර්ගෝපදේශ (Guidelines on Media Reporting on Violence against Women) (2021) < https://novinarkeprotivnasilja.org/wp-content/uploads/2021/12/Guidelines_WEB-VERSION-ENG.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19, 14

65 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ළමා අපයෝජනය පිළිබඳ වාර්තාකරණය: මාධ්‍යවේදීන් සඳහා වූ අත්පොත, (2012) https://childprotection.gov.lk/images/news/Reporting_on_Child_Abuse.pdf ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

66 එතික්ස් අයි (Ethics Eye), 'ගිටාර් වාදකයා බස් රථය තුළදී ගායිකාව ටියුන් කරන්න හදයි? පුවත්පත ලිංගික හිරිහැරය සුළු කොට තැකීමක් සහ එවැනි අපරාධ සාමාන්‍යකරණය කිරීමක් මෙහිදී සිදු කරන්නේ නැද්ද?' (වෙරිටේ මීඩියා, X, 2023 නොවැම්බර් 2) < https://x.com/EthicsEye/status/1720070789419180524> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

67 එතික්ස් අයි (Ethics Eye), 'ඔබ මෙවැනි වාර්තාකරණයන් අනුමත කරනවා ද?' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2024 අප්‍රේල් 1) < www.facebook.com/share/p/17YnavUyam/> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

68 එතික්ස් අයි (Ethics Eye), 'ලිංගික අපරාධ සුළු කොට නොදක්වමු' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2025 සැප්තැම්බර් 17) < www.facebook.com/share/p/1CzcM1GKyd/ > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

69 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ මාධ්‍ය වාර්තාකරණය සඳහා වූ මාර්ගෝපදේශ (Guidelines on Media Reporting on Violence against Women) (2021) < https://novinarkeprotivnasilja.org/wp-content/uploads/2021/12/Guidelines_WEB-VERSION-ENG.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## ඔබ දන්නවාද? ලිංගික අපරාධයකට ලක්වූ වින්දිතයෙකුගේ අනන්‍යතාව හෙළිදරව් කිරීම ශ්‍රී ලංකාවේ නීතියට අනුව දඬුවම් ලැබිය හැකි වරදකි

ලිංගික හිරිහැර, ලිංගික වෘත්තිය සඳහා පොළඹවා ගැනීම, දරුවන් ලිංගිකව සූරාකෑම, ලිංගික අපයෝජනය, රුධිරාසන්න ලිංගික සංසර්ගය, අස්වාභාවික වැරදි, පුද්ගලයින් අතර සිදුවන බරපතල අශෝභන ක්‍රියා හෝ බරපතල ලිංගික අපයෝජනය යන වැරදිවලට ලක්වූ බවට චෝදනා කරන හෝ ලක්වූ බවට තහවුරු වූ ඕනෑම පුද්ගලයෙකුගේ නම හෝ අනන්‍යතාව හෙළිවන යම් කරුණක් මුද්‍රණය කිරීම හෝ ප්‍රකාශයට පත් කිරීම ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 365C වගන්තියට අනුව වරදක් ලෙස සැලකේ. එය වසර දෙකක් දක්වා දීර්ඝ කළ හැකි සිර දඬුවමකින් හෝ දඩයකින් හෝ එම දඬුවම් දෙකෙන්ම හෝ දඬුවම් ලැබිය හැකි වරදකි.

අනන්‍යතාව හෙළි කළ හැක්කේ පහත අවස්ථාවලදී පමණි:

- විමර්ශන කටයුතු සඳහා පොලිස් නිලධාරියෙකු විසින් අවසර ලබා දී ඇති විට
- අපරාධයට මුහුණ දුන් පුද්ගලයා ලිඛිත කැමැත්ත ලබා දී ඇති විට
- වින්දිතයා මියගොස් ඇත් නම්, ඔහුගේ/ඇයගේ ළඟම ඥාතියා ලිඛිත කැමැත්ත ලබා දී ඇති විට
- අපරාධයට ගොදුරු වූ පුද්ගලයා/වින්දිතයා දරුවෙකු හෝ මානසික අස්වාභාවික තත්ත්වයක පසුවන අයෙකු නම්, මව හෝ පියා/භාරකරු ලිඛිත කැමැත්ත ලබා දී ඇති විට

අපරාධ පිළිබඳ මෙවැනි ගැටලුකාරී වාර්තාකරණයන් හේතුවෙන් විමර්ශන ක්‍රියාවලියට පවා බාධා එල්ල විය හැකි අතර, එමගින් අපරාධයට ගොදුරු වූ පුද්ගලයින් යළිත් කම්පනයට (Re-traumatising) පත් කිරීමත්, යුක්තිය පසිඳලීම ප්‍රමාද කිරීමත් සිදු වේ. පාසල්වල නම්, ගම්මාන, පවුලේ අයගේ රැකියා හෝ පදිංචි ප්‍රදේශය පිළිබඳ විස්තර වැනි වක්‍ර තොරතුරු ("Jigsaw identification" හෙවත් විවිධ තොරතුරු ගලපා බැලීමෙන් අනන්‍යතාව හඳුනා ගැනීම) මගින් ද අපරාධයකට මුහුණ දුන් ළමුන් හඳුනා ගැනීමටත්, ඔවුන් සමාජ අපවාදයට සහ හානියට නිරාවරණය වීමටත් ඉඩ ඇති බව "ළමා අපයෝජනය පිළිබඳ වාර්තාකරණය සඳහා වන අත්පොත" පැහැදිලිව අනතුරු අඟවයි.

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- විශේෂයෙන්ම බාලවයස්කරුවන් සම්බන්ධ වාර්තාකරණයේදී පුද්ගල නම්, ඡායාරූප, පාසල්වල නම්, ලිපිනයන්, පවුලේ සාමාජිකයන්ගේ රැකියා හෝ අනන්‍යතාව හඳුනාගත හැකි දෘශ්‍ය තොරතුරු ප්‍රකාශයට පත් නොකර සිටිමු.

**වාර්තාකරණය සඳහා උදාහරණ**

| භාවිතයෙන් වළකිමු | භාවිතයට ගනිමු |
|---|---|
| *"මැදිරිගිරියේ පියෙකු තම 14 හැවිරිදි දියණිය ලිංගික අපයෝජනයට ලක් කරයි"* | *"බාලවයස්කාර දරුවෙකු අපයෝජනය කළැයි මැදිරිගිරියේ පදිංචිකරුවෙකුට චෝදනා"* |

**මෙය වැදගත් වන්නේ ඇයි?** යම් පුද්ගලයෙකුගේ අනන්‍යතාව වරක් හෙළිදරව් වූ පසු එයින් සිදුවන හානිය යථා තත්ත්වයට පත් කළ නොහැක. අපරාධයට මුහුණ දුන් පුද්ගලයින් සමච්චලයට හා සමාජ අපවාදයට ලක් විය හැකි අතර, ඔවුන් සමාජය තුළ දඬුවම් ලැබීමට හෝ ප්‍රචණ්ඩත්වයට මුහුණ දීමට හෝ එය හේතු විය හැක. ඔවුන්ගේ නිර්නාමිකභාවය රැක ගැනීම මගින් ඔවුන්ගේ ආරක්ෂාව, ගෞරවාන්විත බව සහ යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය තහවුරු කෙරේ.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## 3.4 විස්තරාත්මකව අපරාධය වාර්තා කිරීමෙන් වැළකෙමු; උචිත අවස්ථාවලදී පූර්ව අනතුරු ඇඟවීම් (TRIGGER WARNINGS) භාවිතා කරමු

අතිශය බිහිසුණු විස්තර ඇතුළත් කිරීම මගින් අපරාධයට ගොදුරු වූ පුද්ගලයින් යළිත් කම්පනයට (Re-traumatise) පත්වන අතර, සාමාන්‍ය පාඨකයින්ට ද, විශේෂයෙන්ම දරුවන්ට හෝ අතීතයේදී අපයෝජනයට ලක්වූවන්ට එමගින් මානසික පීඩනයක් ඇති විය හැක.[70] "ළමා අපයෝජනය පිළිබඳ වාර්තාකරණය සඳහා වන අත්පොත" අනතුරු අඟවන්නේ එවැනි විස්තර මගින් "දරුවාගේ කම්පනය ප්‍රයෝජනයට ගන්නා අතර ඉන් තවදුරටත් හානි සිදු විය හැකි" බවයි.[71]

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- දීර්ඝ විස්තරවලින් තොරව අපරාධය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට හැකියාව ලබා දෙන භාෂා ශෛලියක් භාවිතා කරමු.
- ශරීර අවයව පිළිබඳ විස්තර, සිදුකළ ක්‍රියාවන් පිළිබඳ විස්තර හෝ නාට්‍යමය ස්වරූපයෙන් සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් වළකිමු.
- හැඟීම් කළඹවනසුළු තොරතුරු වෙනුවට අදාළ සිදුවීමෙහි අපරාධමය ස්වභාවය කෙරෙහි පමණක් අවධානය යොමු කරමු.
- පුවත වාර්තා කිරීමට පෙර "කම්පනයට පත් කළ හැකි පුවතක් පිළිබඳ අනතුරු ඇඟවීමක්" (Trigger warning) ඇතුළත් කරමු. එවිට එය කියවන්නේ ද නැද්ද යන්න තීරණය කිරීමට පාඨකයාට අවස්ථාව ලැබේ.

**මෙය වැදගත් වන්නේ ඇයි?** කම්පනය පිළිබඳ අවබෝධයෙන් යුත් වාර්තාකරණය (Trauma-informed reporting) සඳහා වන මාර්ගෝපදේශ අවධාරණය කරන්නේ, නොසැලකිලිමත් ලෙස තොරතුරු ඇතුළත් කිරීම මගින් අපරාධයට ගොදුරු වූ පුද්ගලයින්ගේ මානසික පීඩනය තීව්‍ර විය හැකි අතර එය පුවත් පරිශීලනය කරන සාමාන්‍ය ජනතාවට ද අහිතකර ලෙස බලපෑ හැකි බවයි.[72] අන්තර්ගතය පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම් (Trigger/content warnings) යනු හානිය අවම කරන ප්‍රායෝගික මෙවලමකි; එමගින් පුවතේ බරපතලකම අඩු නොවන නමුත්, එමගින් මාධ්‍යයේ වෘත්තීමය යුතුකමක් පෙන්නුම් කරන අතර සංවේදී කරුණු සමඟ සම්බන්ධ විය යුතු ආකාරය තීරණය කිරීමට පාඨකයාට යම් පාලනයක් ලබා දෙයි.[73]

70 යුනිසෙෆ් (UNICEF), කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වගකීම් සහගත ලෙස නිරූපණය කිරීම සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ (2021), 16 https://www.unicef.org/rosa/media/11631/file/Guidelines%20on%20Responsible%20representation%20and%20reporting%20of%20violence%20against%20women%20and%20violence%20against%20children.pdf ප්‍රවේශය 2026 පෙබරවාරි 19; එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ මාධ්‍ය වාර්තාකරණය සඳහා වූ මාර්ගෝපදේශ (Guidelines on Media Reporting on Violence against Women) (2021) < https://novinarkeprotivnasilja.org/wp-content/uploads/2021/12/Guidelines_WEB-VERSION-ENG.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

71 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ළමා අපයෝජනය පිළිබඳ වාර්තාකරණය: මාධ්‍යවේදීන් සඳහා වූ අත්පොත, (2012) https://childprotection.gov.lk/images/news/Reporting_on_Child_Abuse.pdf ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

72 මෙන්ටල් හෙල්ත් ඇමෙරිකා (Mental Health America), 'මානසික සෞඛ්‍ය සහ මාධ්‍ය: කම්පනය පිළිබඳ දැනුවත්භාවය සහිත වාර්තාකරණය සඳහා මාර්ගෝපදේශය' (Mental Health and Media: Trauma-Informed Reporting Guide) https://mhanational.org/resources/mental-health-and-media-trauma-informed-reporting-guide/ ප්‍රවේශය 2026 පෙබරවාරි 27.
කම්පනය සහ පුවත්පත් කලාව පිළිබඳ ගෝලීය මධ්‍යස්ථානය (Global Centre for Journalism & Trauma), 'කම්පනය පිළිබඳ දැනුවත්භාවය සහිත පුවත්පත් කලාව සඳහා වන GCJT ශෛලී මාර්ගෝපදේශය' (GCJT Style Guide for Trauma-Informed Journalism) (2021 ජූනි 22) https://gcjt.org/resources/gcjt-style-guide-trauma-informed-journalism ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

73 මිචිගන් විශ්වවිද්‍යාලය (University of Michigan), 'අන්තර්ගත පිළිබඳ අනතුරු ඇඟවීම් සහ කම්පනය ඇති කළ හැකි පුවත් පිළිබඳ අනතුරු ඇඟවීම් සඳහා හැඳින්වීමක්' (An Introduction to Content Warnings and Trigger Warnings) (2020) <https://sites.lsa.umich.edu/equitable-teaching/wp-content/uploads/sites/853/2020/09/An-Introduction-to-Content-Warnings-and-Trigger-Warnings-PDF.pdf> ප්‍රවේශය 2026 පෙබරවාරි 27.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## 3.5 වින්දිතයාට/වරදට මුහුණ දුන් කෙනාට වරද නොපටවා (BLAME-SHIFTING), අපරාධකරු පමණක් වගවීමට ලක් කරමු

ශ්‍රී ලංකාවේ පුවත් වාර්තාකරණය තුළ වින්දිතයාට දොස් පැවරීම බහුලව නිරීක්ෂණය වන අතර, එය ඇඳුම් පැළඳුම්, හැසිරීම, සබඳතා හෝ පෞද්ගලික ඉතිහාසය පිළිබඳ අදහස් දැක්වීම් හරහා ඉතා සූක්ෂ්ම ලෙස සිදුවිය හැක. අපරාධය සඳහා වගකීම වින්දිතයා මත පැටවීම මගින් ලිංගික අපරාධවලට ගොදුරු වූ පුද්ගලයින්ට/වින්දිතයින්ට මානසික වශයෙන් හානි සිදු වේ. එපමණක් නොව, අපරාධ වාර්තා කිරීමට එමගින් ඔවුන් අධෛර්යමත් කරනු ලබන අතර යුක්තිය පසිඳලීමට ද එය බාධා පමුණුවයි.[74]

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- අපරාධමය වගකීමට කිසිදු අදාළත්වයක් නොමැති, අපරාධයට ගොදුරු වූ පුද්ගලයාගේ ඇඳුම් පැළඳුම් හෝ "තේරීම්" පිළිබඳ උපකල්පන ඉදිරිපත් කිරීමෙන් වළකිමු.
- "වැරදි පාරේ ගිහින්" හෝ "තහනම් ගහේ ගෙඩි කන්න ගිහින්" වැනි සදාචාරය පිළිබඳ විනිශ්චයන් ඉදිරිපත් කරන යෙදුම් භාවිතයෙන් වළකිමු. මෙවැනි රාමුගත කිරීම් මගින්, සිදුවූ අපරාධය සහ අපරාධකරුගේ ක්‍රියාව කෙරෙහි අවධානය යොමු කරනවා වෙනුවට, එය වින්දිතයාගේ "චරිතය" හෝ "තේරීම්" පිළිබඳ වාර්තාකරණයක් බවට පත් කරයි.[75]
- පෙර පැවති සබඳතා මගින් ලිංගික එකඟතාව (Consent) අදහස් වන බව හැඟවීමෙන් වළකිමු. අනාචාරයේ හැසිරීම, දික්කසාදය, "දෙමාපියන් නොමැති වීම" හෝ විවාහක අවිවාහකභාවය වැනි තොරතුරු, අපරාධයට මුහුණ දුන් පුද්ගලයා ප්‍රචණ්ඩත්වයට "ඇරයුම් කළ" බව හැඟවීමට භාවිතා කිරීම නිරීක්ෂණය වන අතර, ඉන් වැළකී සිටීම වැදගත් වේ.
- බලහත්කාරකමක් පිළිබඳ චෝදනාවක් පවතින විට, ඒ පිළිබඳව සැකයක් ඇති කරන අයුරින් භාෂාව භාවිතා කිරීමෙන් වළකිමු. උදා: "ඔවුන් පෙම්වතුන් වූ නිසා මෙය පැහැදිලි නැත..."
- ලිංගික ක්‍රියාවන් සඳහා වන එකඟතාව ස්වේච්ඡාවෙන් විය යුතු බවත්, එය ඕනෑම මොහොතක වෙනස් විය හැකි බවත් පැහැදිලිව අවධාරණය කරමු.
- බාලවයස්කරුවන්ට ලිංගික ක්‍රියාවන් සඳහා නීත්‍යනුකූලව එකඟතාව ලබා දිය නොහැකි බව පැහැදිලිව අවධාරණය කරමු. බාලවයස්කරුවන් පිළිබඳව වාර්තා කිරීමේදී, එහි නීතිමය බරපතලකම පිළිබිඹු වන පරිදි "ව්‍යවස්ථාපිත ලිංගික අපරාධ" (Statutory rape) හෝ "නීත්‍යනුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීමක්" (Kidnapping from lawful guardianship) වැනි නීතිමය වශයෙන් නිවැරදි යෙදුම් භාවිතා කරමු.[76]

**වාර්තාකරණය සඳහා නිදසුන්**

| භාවිතයෙන් වළකිමු | භාවිතා කරමු |
|---|---|
| *"අවිවාහක කතක කෙලෙසූ PC වසර 7කට හිරේ"*[77] | *"කාන්තාවක් ලිංගික අපරාධයකට ලක් කළ පොලිස් කොස්තාපල්වරයෙක් අත්අඩංගුවට."* |

74 යුනිසෙෆ් (UNICEF), කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වගකීම් සහගත ලෙස නිරූපණය කිරීම සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ (2021), 16 https://www.unicef.org/rosa/media/11631/file/Guidelines%20on%20Responsible%20representation%20and%20reporting%20of%20violence%20against%20women%20and%20violence%20against%20children.pdf ප්‍රවේශය 2026 පෙබරවාරි 19; එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ මාධ්‍ය වාර්තාකරණය සඳහා වූ මාර්ගෝපදේශ (Guidelines on Media Reporting on Violence against Women) (2021) < https://novinarkeprotivnasilja.org/wp-content/uploads/2021/12/Guidelines_WEB-VERSION-ENG.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

75 එතික්ස් අයි (Ethics Eye), 'ඝාතනයක් සාධාරණීකරණය කිරීමක්?' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2023 ඔක්තෝබර් 10) <https://web.facebook.com/share/p/18Q3f6wZ8P/ > ප්‍රවේශය 2026 පෙබරවාරි 19; එතික්ස් අයි (Ethics Eye), 'වරද බාල වයස්කාර දැරියගේ ද? තරුණයාගේ ද?' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2025 ජනවාරි 24), <https://web.facebook.com/share/p/1FV1YWpoo3/ > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

76 දණ්ඩ නීති සංග්‍රහය (1883 අංක 2 දරන ආඥා පනත) (ශ්‍රී ලංකාව) 352, 363(ඈ) වගන්ති http://hrlibrary.umn.edu/research/srilanka/statutes/Penal_Code.pdf ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

77 එතික්ස් අයි (Ethics Eye), ''කෙලෙසූ' අවශ්‍ය ද? 'අවිවාහක ' අදාළ ද?' (වෙරිටේ මීඩියා, ෆේස්බුක්, 2024 පෙබරවාරි 20), < www.facebook.com/share/p/16PuJveUZq/ > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

| භාවිතයෙන් වළකිමු | භාවිතා කරමු |
| --- | --- |
| *"කනේ අමාරුවක් බව පවසා නිවසේ සිටි දැරිය මව එන විට වැරදි පාරක ගිහින්."*[78] | *"බාල වයස්කාර දැරියක නීත්‍යනුකූල භාරකාරත්වයෙන් අපහරණය කළ සැකකරුවෙක් පොලීසිය විසින් සොයන බව වාර්තා වේ."* |

**මෙය වැදගත් වන්නේ ඇයි?** වගකීම වින්දිතයා/අපරාධයට මුහුණ පෑ පුද්ගලයා වෙත පැවරීමේ රාමුගත කිරීම, ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ වෘත්තීමය වාර්තාකරණයට ඇති ප්‍රබලතම බාධකයකි. සදාචාරාත්මක ජනමාධ්‍යකරණය විසින් සැකය, සමාජ අපවාදය සහ සදාචාරය පිළිබඳ විනිශ්චයන් ඉවත් කරනු ලබන අතර, එහි වගකීම ඊට අදාළ පුද්ගලයා වෙත — එනම් චෝදනා ලැබූ පුද්ගලයා වෙත — යොමු කරනු ලබයි.

## 3.6 අපරාධයට ගොදුරු වූ පුද්ගලයින් අසරණ පිරිසක් වශයෙන් නිරූපණය කිරීමෙන් වැළකෙමු

අපරාධයට ගොදුරු වූ පුද්ගලයින් බොහෝ විට මානසිකව බිඳ වැටුණු, හඬක් නොමැති හෝ එම අපරාධයට අදාළ අනන්‍යතාවක් පමණක් ඇති පිරිසක් ලෙස නිරූපණය කරනු ලැබේ. ක්ලාන්ත වී ඇද වැටෙන දර්ශන, හඬන මුහුණු හෝ කිසියම් පුද්ගලයෙකු කම්පනය ඇති කළ එක් සිදුවීමකට පමණක් සීමා කරන අයුරින් භාෂාව භාවිතා කිරීම මගින් ඔවුන් සතු ස්වයං නියෝජනය සහ පෞරුෂය  (Agency) ගිලිහී යා හැක.

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- අපරාධය වාර්තා කිරීමට, උපකාර පැතීමට හෝ යුක්තිය පතා කටයුතු කිරීමට අපරාධයට ගොදුරු වූ පුද්ගලයින් ගන්නා තීරණ ඉස්මතු කරමු.[79]
- ඔවුන් හුදෙක් අසරණභාවයේ සංකේත බවට පත් කරන දෘශ්‍ය නිරූපණයන් භාවිතා කිරීමෙන් වළකිමු.

**මෙය වැදගත් වන්නේ ඇයි?** අපරාධයට ගොදුරු වූ පුද්ගලයින් කේන්ද්‍ර කරගත් වාර්තාකරණය මගින් ඔවුන්ට සිදු වූ හානිය පිළිගනු ලබන්නේ ඔවුන් සතු ස්වයං නියෝජනය සහ පෞරුෂය අහිමි නොකරන අයුරිනි. එමගින් ඔවුන් දුර්වල පිරිසක් ලෙස හෝ ජීවිත කාලය පුරාම හානියට පත් වූවන් ලෙස හුවා දක්වන මතවාදයන් තීව්‍ර වීම වළක්වයි.

78 එතික්ස් අයි (Ethics Eye), 'වරද බාල වයස්කාර දැරියගේ ද? නැතිනම් තරුණයාගේ ද?' (වෙරිටේ මීඩියා, Facebook, 2025 ජනවාරි 24), < www.facebook.com/share/p/1Ai1PB9txd/> ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

79 යුනිසෙෆ් (UNICEF), කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වගකීම් සහගත ලෙස නිරූපණය කිරීම සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ (2021), 16 https://www.unicef.org/rosa/media/11631/file/Guidelines%20on%20Responsible%20representation%20and%20reporting%20of%20violence%20against%20women%20and%20violence%20against%20children.pdf ප්‍රවේශය 2026 පෙබරවාරි 19;

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## 3.7 අපරාධයට අදාළ සන්දර්භය විස්තර කර, සහය ලබා ගැනීමේ මාර්ග වෙත ඊට මුහුණ දුන් පුද්ගලයින් යොමු කරමු

ලිංගික අපරාධ හුදකලා සිදුවීම් ලෙස සිදු වන්නේ කලාතුරකිනි. එම සිදුවීම් බොහෝ විට දිළිඳුකම, ලිංගික අධ්‍යාපනය නොමැතිකම, දුර්වල නීතිමය ආරක්ෂාව, පීතෘමූලික සම්මතයන් සහ දඬුවම් නොලැබීමේ සංස්කෘතිය වැනි ව්‍යුහාත්මක ගැටලුවල ප්‍රතිඵලයකි.[80] මහජන ආකල්ප හැඩගැස්වීමේදීත්, මෙවැනි පුළුල් රටාවන් තේරුම් ගැනීමට මහජනතාවට උපකාර කිරීමේදීත්, මාධ්‍යවේදීහු වැදගත් කාර්යභාරයක් ඉටු කරති.

**මෙය ප්‍රායෝගිකව භාවිතා කළ හැක්කේ කෙසේ ද?**

- සිදුවීම් හුදකලා සිද්ධීන් ලෙස සැලකීම වෙනුවට ඒ පසුපස ඇති ව්‍යුහාත්මක සාධක ඉස්මතු කරමු. උදාහරණයක් ලෙස: "14 හැවිරිදි දැරියක් ගැබ් ගනී" යනුවෙන් වාර්තා කිරීම වෙනුවට, නව යොවුන් වියේ ගැබ් ගැනීම් වර්තමානයේ පවතින සමාජ සංසිද්ධියක් ලෙසත්, එහි අහිතකර බලපෑම් සහ එය වැළැක්වීමට කළ හැකි දේ ආශ්‍රිතවත් පුවත රාමුගත කළ හැක.
- පැහැදිලි සමාජ මැදිහත්වීම් සඳහා ඉඩ ලබා දෙන අතරම, අපරාධයට ගොදුරු වූ පුද්ගලයින්ට උපකාර ලබා ගත හැකි සේවාවන් වෙත ද ඔවුන් යොමු කරමු.

**සහය ලබාගත හැකි ක්ෂණික ඇමතුම් අංක:**

- ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය – 1938
- පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය – 011 2826444 / 011 276 8076
- කාන්තා පිහිට (Women In Need (WIN)) – 011 471 8585
- ශ්‍රී ලංකා පවුල් සැලසුම් සංගමය – 011 255 5455
- මා-සෙවණ (සර්වෝදය) – 011 265 5577

**මෙය වැදගත් වන්නේ ඇයි?** සන්දර්භගත වාර්තාකරණය මගින් මහජන අවබෝධය වැඩිදියුණු කරනු ලබන අතර, ඉන් සමාජ අපවාදය අභියෝගයට ලක් කෙරේ. එමෙන්ම, අපරාධයට ගොදුරු වූ පුද්ගලයින්ට යථා තත්ත්වයට පත් වීමටත්, යුක්තිය ළඟා කර ගැනීමටත් අවශ්‍ය වන උපකාරක සේවාවන් කරා ඔවුන් යොමු කරනු ලබයි.

80 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ මාධ්‍ය වාර්තාකරණය සඳහා වූ මාර්ගෝපදේශ (*Guidelines on Media Reporting on Violence against Women*) (2021) < https://novinarkeprotivnasilja.org/wp-content/uploads/2021/12/Guidelines_WEB-VERSION-ENG.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19.

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

## සාරාංශය - ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තාකරණයට අදාළ පිරික්සුම් ලැයිස්තුව

| | වළකිමු | පිළිපදිමු |
|---|---|---|
| 3.1 | අපරාධයට ගොදුරු වූ පුද්ගලයින් “අපිරිසිදු” හෝ “කෙලෙසුණු” බව හැඟවෙන “දූෂණය” හෝ “කෙලෙසීම” වැනි අපහාසය උපදවන වචන භාවිතය. | ලිංගික අතවරය හෝ ලිංගික අපයෝජනය සඳහා “ලිංගික අපරාධ” වැනි නීත්‍යනුකූලව නිවැරදි සහ අපරාධය කෙරෙහි අවධානය යොමු කරන යෙදුම් භාවිතා කරමු. |
| 3.2 | ලිංගික අපරාධවල බරපතලකම අවම කරන ව්‍යංගාර්ථ, හාස්‍යජනක වාක්‍ය ඛණ්ඩ හෝ නොපැහැදිලි යෙදුම් භාවිතය (උදා: “අමුතු පාඩමක්” හෝ “අමුතු සත්කාරයක්” වැනි යෙදුම්). | අපරාධයේ බරපතලකම පිළිබිඹු වන පැහැදිලි සහ සෘජු භාෂාව භාවිතා කරමු. |
| 3.3 | වෙන් වෙන් කරුණු උපයෝගී කරගනිමින් පුද්ගලයෙකු හඳුනා ගැනීමට මඟ පාදන (Jigsaw identification) පුද්ගල නම්, ඡායාරූප, පාසල්වල නම්, ලිපින, පවුල් සබඳතා හෝ විස්තර පළ කිරීම.[81] | නිර්නාමිකභාවය පූර්ණ ලෙස ආරක්ෂා කරමු: අපරාධයට ගොදුරු වූ පුද්ගලයා හඳුනා ගැනීමට යොදා ගත හැකි විස්තර ඉවත් කිරීමට හෝ විශේෂිත නොවන ආකාරයට වාර්තා කිරීමට හෝ වග බලා ගමු (විශේෂයෙන් ළමුන් හෝ පවුලේ සාමාජිකයින් සම්බන්ධ සිදුවීම්වලදී). |
| 3.4 | ප්‍රහාරය පිළිබඳ බිහිසුණු විස්තර, ශරීරයේ අවයව පිළිබඳ විස්තර හෝ නාට්‍යමය ස්වරූපයෙන් ඉදිරිපත් කරන සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ ඇතුළත් කිරීම. | ලිංගික ප්‍රචණ්ඩත්වය ගැන සාකච්ඡා කිරීමේදී “සංවේදී පුවතක්” බවට අනතුරු ඇඟවීම් ඇතුළත් කරමු; ලිංගික කරුණු ඉස්මතු නොකර අපරාධය කෙරෙහි පමණක් අවධානය යොමු කරන ලෙස පැහැදිලි අන්දමින් භාෂාව භාවිතා කරමු. |

81 ‘“ජිග්සෝ හඳුනාගැනීම” (Jigsaw identification) සිදු වන්නේ යම්කිසි ප්‍රකාශනයක හෝ විවිධ ප්‍රකාශන කිහිපයක හෝ සඳහන් වන එකිනෙකට වෙනස් තොරතුරු ගැලපීම මගින් අදාළ වින්දිතයා කවුරුන්ද යන්න එම වාර්තා කියවන පාඨකයින්ට හඳුනා ගැනීමට හැකි වූ විටය’ ස්වාධීන පුවත්පත් ප්‍රමිති සංවිධානය (Independent Press Standards Organisation), ලිංගික අපරාධ: මාධ්‍යවේදීන් සහ සංස්කාරකවරුන් සඳහා වූ මාර්ගෝපදේශ (*Sexual offences: Guidance for journalists and editors* (July 2023)) (2023 ජූලි) < www.ipso.co.uk/wp-content/uploads/2024/04/sexual-offences-guidance-2023.pdf > ප්‍රවේශය 2026 පෙබරවාරි 19

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්

| | වළකිමු | පිළිපදිමු |
|---|---|---|
| 3.5 | ඇඳුම් පැළඳුම්, හැසිරීම්, සබඳතා හෝ පෞද්ගලික ඉතිහාසය මත පදනම්ව අපරාධයට ගොදුරු වූ පුද්ගලයා මත වරද පැටවීම හෝ විනිශ්චයන්ට එළැඹීම. | වගකීම අපරාධකරු මතම රඳවමු; කැමැත්ත සහ බලහත්කාරය අතර වෙනස පැහැදිලිව දක්වමු; බාලවයස්කරුවන්ට නීත්‍යනුකූලව කැමැත්ත ලබා දිය නොහැකි බව අවධාරණය කරමු. |
| 3.6 | අපරාධයට ගොදුරු වූ පුද්ගලයින් අසරණ, බිඳුණු හෝ අපරාධයට අදාළ අනන්‍යතාවක් පමණක් ඇති පුද්ගලයින් ලෙස නිරූපණය කිරීම (හඬන හෝ ඇද වැටී සිටින ඡායාරූප භාවිතය ද මෙයට ඇතුළත් වේ). | අපරාධයට ගොදුරු වූ පුද්ගලයින් ස්වයං නියෝජනය සහ පෞරුෂය සතු පුද්ගලයින් ලෙස නිරූපණය කරමු—අසරණභාවය වෙනුවට ඔවුන්ගේ ශක්තිය, ඔරොත්තු දීමේ හැකියාව සහ හඬ ඉස්මතු කරමු. |
| 3.7 | සිදුවීම හුදෙකලා සිද්ධියක් ලෙස සැලකීම හෝ සහය ලබා ගත හැකි මාර්ග හඳුන්වා නොදී වාර්තාකරණය අවසන් කිරීම. | අදාළ අවස්ථාවලදී පුළුල් සමාජ සන්දර්භය පිළිබඳ විස්තර වාර්තා කරමු; අපරාධයට ගොදුරු වූ පුද්ගලයින් වෙනුවෙන් උපකාරක සේවා හෝ ක්ෂණික ඇමතුම් අංක ඇතුළත් කරමු. |

සියලුම හිමිකම් ඇවිරිණි © 2026 වෙරිටේ රිසර්ච්



Verité Research
Strategic Analysis for Asia

Verité Media
Better Media Culture

Supported by Kingdom of the Netherlands


A | No. 165/1, Park Road, Colombo 5
T | +94 11-2055544
E | reception@veriteresearch.org
W | www.veriteresearch.org